# බළන්ගොඩ නගර සභාව

## 2021-12-09 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2021.12.09**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 8. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රී | රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 12. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 15. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |

**නිලධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්.එච්.ඒ.කරුණාරත්න මිය

**01. පසුගිය මහ සභා වාර්තාව, හා විශේෂ සභාවේ සභා වාර්තා සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, සභාව සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගැනීමෙන් අනතුරුව 2021-11-09 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2021-11-16 දින පැවති විශේෂ මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් 2021-11-09 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2021-11-16 දින පැවති විශේෂ මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රීනී එම්. ශාන්තිලේඛා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා විසින් මෙදින සභා වාර්තාවේ සංශෝධනයන් තිබේදැයි විමසූ අතර, සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2021-11-09 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2021-11-16 දින පැවති විශේෂ මහ සභා වාර්තාව සභා සම්මත විය.

**පෙ.ව 10.10 ට පමණ ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය සභාවට පැමිණෙන ලදී.**

**පෙ.ව 10.11 ට පමණ ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

අද දින නිවේදන කිසිවක් නොමැති බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

- අසනීප තත්ත්වයක් හේතුවෙන් 2021-12-09 දින මහ සභාවට සහභාගී නොවන බවත්, නිවාඩු අනුමත කර දෙන ලෙසත්, ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් කරන ලද ඉල්ලීම ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදුව නිවාඩු අනුමත කරන ලදී.

- තමන් බළන්ගොඩ පදික වේදිකාවේ වෙළඳාම් කටයුතු කරන අතර, දැනට වෙළඳාම් කටයුතු කිරීමට ස්ථිර ස්ථානයක් නොමැති බවත්, ඒ සඳහා බළන්ගොඩ බස් නැවතුම්පොළ ගුවන් පාලම යට කොටස ලබා දෙන ලෙසත් අවසර ඉල්ලා බළන්ගොඩ, අනඳමෙත්ගම, ශෛලතලාරාම මාවත ලිපිනයේ පදිංචි එල්. ඒ. නිශාන්ත සෝමරත්න යන අය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

**පෙ.ව 10.16 ට පමණ ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

- බළන්ගොඩ පදික වෙළඳාමේ වෙළඳාම් කළ අතර, ස්ථිර කඩ කාමරයක් ලබා දෙන මෙන් කිහිපවරක් නගර සභාවෙන් ඉල්ලා සිටිය නමුත් එය ඉටු නොවූ බවත්, මේ වන විට පදික වෙළඳාම තහනම් කර ඇති නිසා තමන්ට කිසිදු ආදායමක් නොමැති බවත්, ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති බැවින් දරුවන් තුන්දෙනා සහ බිරිඳ සමඟ ඉතා අසරණ තත්ත්වයට පත්ව ඇති බවත් පවසා බළන්ගොඩ බස් නැවතුම්පොළ ගුවන් පාලම යට කොටස වෙළඳාම් කටයුතු සඳහා ලබා දෙන ලෙස අවසර ඉල්ලා බළන්ගොඩ, මුගුණමලය ලිපිනයේ පදිංචි ගොඩගේ සමන්ත කුමාර යන අය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් බස්නැවතුම්පළෙහි ඉඩම නගර සභාවට අයිති නැති අතර, එය නාගරික සංවර්ධන අධිකාරියට අයත් බැවින් කිසිදු ඉදිකිරීමක් කළ නොහැකි බව ද ඉරිදා පොළ සඳහා ගෙවීමට ඇති බදු මුදල් ගෙවා අවසන් නිසා ඔප්පුව ගන්නා ලෙස ද ගරු සභාපතිතුමා මාස දෙකකට පෙර බස් නැවතුම්පළ පදික වෙළඳාමේ නිරත වූ දෙදෙනෙක් ගැන සඳහන් කළ අතර, එම දෙදෙනාගෙන් රංජි යන අයට තුන්වන කඬේ හිමිව ඇති බව ද අනෙක් පුද්ගලයා මිය ගොස් ඇති බව ද මේ නිසා එම දෙදෙනාගේ ගැටලුව විසඳී ඇති බව ද බිත්තර විකුණන කෙනෙකු කඩයක් ඉල්ලූ ස්ථානය පින්තාලියක් ඉදි කිරීමට අවශ්‍ය බව පැවසූ නමුත් පින්තාලියට අමතරව බස්නැවතුම්පළ ඇතුලට වන්නට ජල කරාම 04 ක් හා හෝටල් පවතින බැවින් ජලය පානය කිරීම අවශ්‍ය අයට ඒ සඳහා පහසුකම් පවතින බව ද එළවළු වෙළඳාම සඳහා එම ස්ථානය ලබා දුනහොත් නගර සභා ආඥා පනත හා නගර සභාව විසින් ගෙනෙන ලද පනත් උල්ලංඝනය කිරීමක් වන බව ද මේ සියලුම දේ සම්බන්ධව කල්පනා කර තීරණ ගන්නා ලෙස ද පවසන ලදී.

- දෙහිගස්තලාව ක්‍රිස්තියානි දේවස්ථානය අසල සිට ආරද්‍යා හෝටලය ඉදිරිපිට දක්වා ඇති කාණුවෙහි ජලය බැස නොයාම නිසා ජනතාව අපහසුතාවයට පත්ව ඇති බැවින් එම කාණු පද්ධතිය පිළිසකර කර දෙන මෙන් ඉල්ලා බළන්ගොඩ, දෙහිගස්තලාව, ජේ.එම් වීරසේකර බණ්ඩාර යන අය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මාර්ග සංවර්ධන අධිකාරියට යොමු කර, නගර සභාවේ යන්ත්‍රෝපකරණ ලබා දී මෙම කාණුව එක් අවස්ථාවක සකස් කිරීමට සූදානම් වූ නමුත් මාර්ග සංවර්ධන අධිකාරියට මුදල් නොමැති බව පවසා Readymade කොන්ක්‍රීට් කාණු කොටස් තැනින් තැනට යෙදූ බව ද නැවත වරක් මේ පිළිබඳව දැනුවත් කර ක්‍රමවත්ව කාණුව සකස් කරන ලෙස ඉල්ලීම් ලිපියක් මාර්ග සංවර්ධන අධිකාරියට යොමු කිරීම සුදුසු බව ද පවසන ලදී.

**පෙ.ව 10.28 ට පමණ ගරු නාගරික මන්ත්‍රීනි පී.කේ.එන්.ටී.ඩී. සමරසේකර මැතිතුමිය සභාවට පැමිණෙන ලදී.**

**පෙ.ව 10.30 ට පමණ ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

**පෙ.ව 10.31 ට පමණ ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

- බළන්ගොඩ නගර මධ්‍යයේ පිහිටි වටරවුම් සඳහා ප්‍රචාරණ පුවරු සවි කිරීම හා එම වටරවුම් නඩත්තු කිරීම සඳහා වාර්ෂිකව නගර සභාවට ගෙවිය යුතු මුදල දන්වන ලෙස පවසමින් බළන්ගොඩ, හපුතලේ පාර, නො.27, මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී ආයතනයේ දන්තික අමරසිංහ යන අය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

මෙහි දී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා, උස අඩි 01 ක් හා දිග අඩි 06ක් වන ප්‍රචාරක පුවරු සවි කිරීමට මෙම ආයතනය අවසර ඉල්ලා ඇති බව ද මෙම වටරවුම් තුළට හරක් පැමිණ තණකොළ කන අතර, එය වැළැක්වීම සඳහා අලංකාර වැටක් යෙදීම සුදුසු බව ද නඩත්තු සඳහා මුදලක් අය කර ගත යුතු බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා පැවසුවේ නඩත්තු සඳහා මාසයකට කොපමණ මුදලක් වැය වන්නේ දැයි ගණනය කර ඊට සමාන මුදලක් ගාස්තුවක් වශයෙන් මාසිකව හෝ වාර්ෂිකව අය කර ගැනීම සුදුසු බවයි.

ඒ අනුව ගරු සභාපතිතුමා, ගාස්තුව තීරණය කර වාර්තාවක් මීළඟ මහ සභාවට යොමු කිරීමට කටයුතු කරන ලෙස පවසන ලදී.

- බළන්ගොඩ මහජන පුස්තකාලයේ කුමන හෝ ආදේශක තනතුරක් සඳහා බඳවා ගන්නා ලෙස ඉල්ලමින් බළන්ගොඩ, කරව්කැටිය පාර, නො. 49/1 ලිපිනයේ පදිංචි අභිමානි ඉමේෂා කහංගම යන අය විසින් අයදුම්පතක් සමඟ ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

මෙහි දී අදහස් දැක් වූ ගරු සභාපතිතුමා පළාත් සභාවට යොමු කර අවශ්‍ය උපදෙස් ගැනීම සුදුසු බව පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා, විවිධ දේ ඉල්ලමින් සභාවට ලියුම් ලැබෙන බැවින් නිසි ක්‍රමවේදයක් සකස් විය යුතු බව ද මෙම ලිපිය අනුව බඳවා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳව පැහැදිලි කිරීමක් කරන ලෙස ද පවසන ලදී.

මේ සම්බන්ධව ලේකම්තුමියගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා පැවසුවේ අවශ්‍ය කටයුතු කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස්තුමා වෙත යොමු කරන ලෙසයි.

- බළන්ගොඩ, පෙට්ටිගල පාර, 126 ලිපිනයේ පදිංචි ඩබ්.ඩබ්. මැක්ස්වර්ත් යන අය විසින් තමන්ගේ නිවස ඉදිරිපිට ඇති කාණුව තණකොළ පැළ වී සම්පූර්ණයෙන්ම වැසී ඇති අතර,එය සුද්ධ කර දෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මෙම ලිපියේ පිටපතක් සමඟ විධායක ඉංජිනේරු කාර්යාලයට යොමු කිරීම සුදුසු බව පැවසීය.

- තම නිවස අසලින් නගරයේ අප ජලය ගලා යන ප්‍රධාන කාණුවක් පිහිටා ඇති අතර, නිවස හා කාණුව වෙන් කරමින් ඉදි කර ඇති කලු ගල් බැම්ම පතුල සේදී ගොස් කඩා වැටුණු බව ද පස් තට්ටුව සේදී ගොස් නිවසේ අත්තිවාරම මතු වී ඇති බව ද මෙය අවදානම් තත්ත්වයක් බැවින් පැති බැම්ම හා කාණු සකස් කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස බළන්ගොඩ, බාන්ස් රත්වත්ත මාවත, අංක 35/20 ලිපිනයේ පදිංචි ශ්‍යාමා සිරිනි යන අය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  ගරු සභාපතිතුමා අදහස් දක්වමින් කාණුව පමණක් ඉදි කර ඇති අතර, නිවෙස් හිමියන් එය මූලික කරගෙන කාණු ගැට්ට උඩ බැම්ම ඉදි කර ඇති බව ද එහි වැරැද්ද නිවෙස් හිමියන්ගේ බව ද පවසන ලදී.

  ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, එම ස්ථානයේ පාරක් ඇති අතර, අවුරුදු කිහිපයකට පෙර බැම්මක් ඉදි කිරීම නිසා මිනිසුන් කුඹුරෙන් ගමන් කළ බව ද තානායම අසලින් පාර නිදහස් කර දීමට කටයුතු කිරීම සුදුසු බව පැවසීය.

  ගරු සභාපතිතුමා අදහස් දක්වමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මන්ත්‍රීවරුන් සඳහා මිලියනයක් ලබා දෙන බවට පැවසූ අවස්ථාවේ දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා තමන්ට ලැබෙන ප්‍රතිපාදනයන් මඟින් මෙය සිදු කිරීමට සූදානම් වූ නමුත්, එම ප්‍රතිපාදනයන් නොලැබුණු නිසා නොහැකි වූ අතර ඉන්පසු නගර සභා අයවැය මඟින් කර ගැනීමට ද නොහැකි වූ බව ද විශ්‍රාමික ගුරුවරියකගේ ඉඩමකට ප්‍රශ්නයක් වන බව පවසා විරෝධතාවයක් ඉදිරිපත් වූ බැවින් එම පාර සකස් කිරීමේ කාර්යය නොකෙරුණු බව ද පැවසීය.

  මෙහි දී ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා කුඹුර ලබාගෙන ඇත්තේ කවුදැයි විමසන ලදී.

  ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් එම කුඹුර විජේසිංහ යන අය ලබාගෙන තිබුණු අතර, ඔහු අසනීප වූ පසු විකිණීමට නොහැකි වූ බව ද එහි පාරක් නොතිබුණු බැවින් තමන් භුක්ති විඳින ඉඩමෙන් පාර ලබා දුන් බව ද එවකට අඩි 10 ක රිසිවේෂන්

එකක් තමන් විසින් ගැසට් කළ බව ද ගොඩ ඉඩම අඩි 12 ක් වන අතර, ඉතිරි කොටස කුඹුරු ඉඩම බව ද විශ්‍රාමික ගුරුවරිය සමඟ තමන් සාකච්ඡා කරන බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ජී. චන්ද්‍රලතා මැතිතුමිය පැවසුවේ ලිපියේ සඳහන් කාරණා පිළිබඳව අවධානය යොමු කර, කාණු ගැට්ට පතුලත් සමඟ සකස් කර දෙන ලෙසයි.

ඒ අනුව ගරු සභාපතිතුමා, මෙම ඉල්ලීම කර්මාන්ත කමිටුවට යොමු කර, නඩත්තු යටතේ සිදු කරන ලෙස පැවසීය.

- අංක 21/16, හුණුකුඹුර පාරේ පිහිටි තමන්ගේ වෙළඳසැල දිරාපත් වී ඇති අතර, වෙළඳසැල් පේළියක එක් වෙළඳසැලක් වන මෙම වෙළඳසැල අනෙකුත් වෙළඳසැල් මට්ටමට පමණක් තනා ගැනීමට අවසර ඉල්ලා ඒ.ටී.සෙල්වි යන අය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

ගරු සභාපතිතුමා මේ සම්බන්ධව ස්ථානීය පරීක්ෂණයක් කරන ලෙස කාර්මික නිළධාරී වෙත පැවසීය.

## 04. ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම

04:01 සභාව සතු වාහන සඳහා අවශ්‍ය 600 × 16, 11 × 28, 13.6 × 28 ප්‍රමාණයේ ටයර් හා ටියුබ් ලබා ගැනීම සඳහා මිළ ගණන් විවෘත කිරීම

මිල ගණන් විවෘත කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාළ මිල ගණන් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව පෙරේරා ටයර් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ්, සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව හා ජයන්ති ටයර් සෙන්ටර් යන ආයතනවලින් මිල ගණන් ඉදිරිපත් කර තිබූ අතර, අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ පහත ආයතනයන්ගෙන් 600 × 16, 11 × 28, 13.6 × 28 ප්‍රමාණයේ ටයර් හා ටියුබ් ලබා ගැනීම හා සේවාව ලබා ගැනීමෙන් පසු මුදල් ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

| ආයතනය | ටයර් හා ටියුබ්වල ප්‍රමාණය | අවශ්‍ය ටයර් හා ටියුබ්වල ප්‍රමාණය | ඒකක මුදල |
|---|---|---|---|
| පෙරේරා ටයර් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 600 × 16 ටයර් | 06 | රු. 13,850.00 |
| පෙරේරා ටයර් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 600 × 16 ටියුබ් | 06 | රු. 1,370.00 |
| පෙරේරා ටයර් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 11 × 28 ටයර් | 02 | රු. 55,020.00 |
| පෙරේරා ටයර් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 11 × 28 ටියුබ් | 06 | රු. 5,475.00 |
| පෙරේරා ටයර් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 13.6 × 28 ටයර් | 04 | රු. 65,990.00 |
| ජයන්ති ටයර් සෙන්ටර් | 13.6 × 28 ටියුබ් | 06 | රු. 42,600.00 |

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:02 ZA 9835 දරණ ගලි බවුසරයේ දැනට පවතින කොම්ප්‍රෙෂර් එක වෙනුවට වෙනත් කොම්ප්‍රෙෂර් එකක් යෙදීම, අඟල් 02 බටයක් දැමීම හා ඔයිල් ටැංකිය, P.T.O සාෆ්ට් එක, ඉන් අවුට් කරාමේ පුලියේ රේසර් දෙකක් දැමීම, ඕෆ්ලෝ ටැංකිය යන අමතර කොටස් වෙනස් කර, වාහනය අලුත්වැඩියා සිදු කිරීම සඳහා මිල ගණන් විවෘත කිරීම

මිල ගණන් විවෘත කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාළ මිල ගණන් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.පී.පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව ලක්මිණි මෝටර්ස්, නැෂනල් මෝටර්වේස් හා තෙබුවන ගරාජ් යන ආයතනවලින් මිල ගණන් ඉදිරිපත් කර තිබූ අතර, අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ තෙබුවන ගරාජ් වෙතින් වගකීම් කාලය මාස 12 ක් සහිතව (ජපන් රීකන්ඩිෂන්),

- කොම්ප්‍රෙෂර් එක වෙනුවට වෙනත් කොම්ප්‍රෙෂර් එකක් යෙදීම, අඟල් 02 බටයක් දැමීම හා ඔයිල් ටැංකිය, P.T.O සාෆ්ට් එක, ඉන් අවුට් කරාමේ පුලියේ රේසර් දෙකක් දැමීම, ඕෆ්ලෝ ටැංකිය - රු. 383,500.00
- කොම්ප්‍රෙෂර් ඔයිල් ලීටර 12 ක් ( ඩෙලෝගෝල්ඩ්) රු. 17,000.00

- සියලුම කොටස් වෙනස් කර සවි කිරීම සඳහා - රු. 38,850.00 ක් වශයෙන්,

රු. 439,350.00 ක මිලකට අදාල සේවාව ලබා ගැනීම හා සේවාව ලබා ගැනීමෙන් පසු මුදල් ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:03 2022 වර්ෂය සඳහා අවශ්‍ය ගල් වැලි මිල දී ගැනීම වෙනුවෙන් මිල ගණන් විවෘත කිරීම

මිල ගණන් විවෘත කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාළ මිල ගණන් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව තිරණ කන්ට්‍රක්ෂන්, B.M.U නිශාන්ත හා T.S.D සොයිසා යන සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් ලැබී තිබූ අතර, අවම මිල ගණන් හා කොන්දේසි ඉදිරිපත් කළ පහත සඳහන් සැපයුම්කරුවන්ගෙන් ගල් අයිතම හා වැලි මිල දී ගැනීම හා සේවාව ලබා ගැනීමෙන් පසු මුදල් ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

| අයිතමය | මිල රු. | සැපයුම්කරු |
|---|---|---|
| කලු ගල් 6" x 9" | 5,500.00 | T.S.D සොයිසා |
| කලු ගල් 4" | 7,500.00 | B.M.Uනිශාන්ත/T.S.D සොයිසා |
| කලු ගල් 3" | 7,300.00 | B.M.Uනිශාන්ත |
| කලු ගල් 2" | 8,000.00 | B.M.Uනිශාන්ත |
| කලු ගල් 1" | 7,490.00 | T.S.D සොයිසා |
| කලු ගල් 1 1/2" | 7,490.00 | T.S.D සොයිසා |
| කලු ගල් ක්‍රෂර් 3/4" | 7,950.00 | T.S.D සොයිසා |
| කලු ගල් 3/4" | 7,950.00 | T.S.D සොයිසා |
| කලු ගල් 1/2" | 7,950.00 | B.M.U නිශාන්ත |
| චිප්ස් ¾ | 7,490.00 | T.S.D සොයිසා |
| ගල් කුඩු | 7,490.00 | T.S.D සොයිසා |
| ABC මිශ්‍රණය | 7,950.00 | T.S.D සොයිසා |
| ගංගා වැලි | 11,450.00 | B.M.U නිශාන්ත |

| | | |
|---|---|---|
| බොරලු (ග්‍රැවල්) | 6,800.00 | B.M.U නිශාන්ත |
| ගඩොල් | 22.00 | B.M.U නිශාන්ත |

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:04 වීථි පහන් සඳහා LED Cobra ලයිට් වොට් 150 බල්බ් 25 ක් මිල දී ගැනීම සඳහා මිල ගණන් විවෘත කිරීම

මිල ගණන් විවෘත කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාළ මිල ගණන් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව සුගත් ඉලෙක්ට්‍රිකල්, ලෝටස්, ශක්ති එන්ටප්‍රයිසස්, Orange (බළන්ගොඩ), NMI හා Oral Coparation ( Orange ) යන ආයතනවලින් මිල ගණන් ලැබී තිබුණු අතර, අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති Oral Coparation ( Orange) වෙතින් එකක් රු. 9,906.00 ක් වන මිලකට LED Cobra ලයිට් වොට් 150 බල්බ් 25 ක් මිල දී ගැනීම හා සේවාව ලබා ගැනීමෙන් පසු මුදල් ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

## 05. කල් දී ඇති ප්‍රශ්න

### 05:01 ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසිංහ මැතිතුමිය

05:01:01 බුද්ධ ජයන්ති මාවතේ උඩ කොටසේ 2017 වර්ෂයේ බිම් කට්ටි සැලැස්ම අනුමත කිරීමේ දී පොදු පහසුකම් සඳහා ස්ථානයක් වෙන් කර ඇති ද?

2017 වර්ෂයේ බිම් කට්ටි සැලසුම් අංක 4692 දරණ පිඹුරේ ඇති කැබලි අංක 62 පොදු කටයුතු සඳහා භාවිත කිරීමට යෝජිතව ඇත.

05:01:02 නගර සභාව මඟින් නිකුත් කරන ලද අයදුම්පත්‍රවල පසුගිය සභාවාරයක දී පෙන්වා දුන් පරිදි එම අයදුම්පත්‍ර නිවැරදි කර ඇත් ද? මහජනතාව දැනුවත් කිරීමට ගත් පියවර කවරේ ද?

මේ සඳහා පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා, නගර සභාව මඟින් ගොඩනැඟිලි හා බිම් කට්ටි අයදුම්පත් සංස්කරණය කිරීමක් සිදු නොකරන අතර, එය සකස් කරනු ලබන්නේ නාගරික

සංවර්ධන අධිකාරිය විසින් බව ද එය සංවර්ධන සැලැස්මට අනුව පිළිගත් පොදු ක්‍රමවේදයක් යටතේ ඉදිරිපත් කර ඇති බව ද එහි දී අයදුම්කරුට අදාල කොන්දේසි හා එකී ක්‍රමවේදයන්ට අනුගතව සැලසුම් ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට සිදු වන බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රිනී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය පැවසුවේ පර්චස් 06 ක් සඳහා අනුමැතිය ලබා නොදෙන බව ද පුද්ගලයෙකු අයදුම්පත්‍රය මුදල් දී ලබා ගන්නා අවස්ථාවේදීම අවම වශයෙන් පර්චස් 12 ක් තිබිය යුතු බවට දැනුවත් කිරීමක් කරන ලෙස ද ජල ටැංකිය අසල අධි ආරක්ෂිත කලාපයක් ලෙස නම් කර ඇති කොටස සඳහා මෙම ගැටලුව ඇති වී ඇති බව ද පවසන ලදී.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් 2022 වර්ෂයේ දී මෙම ප්‍රමාණය සංශෝධනය කර ගැසට් පත්‍රයක් නිකුත් වන බව ද අයදුම්පත්‍රය ලබා ගන්නා අවස්ථාවේ දී අදාල දැනුවත් කිරීම සිදු කරන ලෙස විෂය නිළධාරීන්ට දැනුම් දෙන බව ද පැවසීය.

## 06. කල් දී ඇති යෝජනා

### 06:01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා

06:01:01 ගබඩා අවශ්‍යතා සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| ද්‍රව්‍ය | ප්‍රමාණය | දැනට ගබඩාවේ ඇති ප්‍රමාණය |
|---|---|---|
| Computer sheet (4 copy – A4 size) | 10 | 02 |
| Computer sheet (4 copy – සරප්) | 10 | 02 |
| නිවාඩු අයදුම්පත් | 2000 | 500 |
| පැමිණීමේ ලේඛණ | 10 | 04 |
| නිවාඩු ලේඛණ | 05 | 03 |
| වැය ලෙජර් | 10 | 02 |
| Colour A4 කහ පාට | 01 | - |
| Colour A4 රෝස පාට | 01 | - |
| Colour A4 කොළ පාට | 01 | - |
| වයිට්බෝඩ් පෙන් | 12 | 03 |
| මාර්කර් පෙන් | 06 | - |
| 12W Bulb | 20 | - |
| Order පොත් | 100 | 05 |
| හයිලයිට් පෙන් | 12 | 02 |

| | | |
|---|---|---|
| දෙපියන් ෆයිල් | 100 | 30 |
| නෝමල් ෆයිල් | 500 | 200 |
| පෝස්ට් ඉට් පැකට් | 10 | 01 |
| පන්චර් | 05 | - |
| කැල්කියුලේටර්ස් | 10 | 02 |
| ගම් බෝතල් (පොඩි) | 20 | 02 |
| ඉන්ධන ඉල්ලීමේ කොළ | 1000 | 200 |
| පෙර පාසල් පැමිණීමේ ලේඛන | 10 | 01 |
| mp 2014 HS Toner | 05 | 01 |
| 6 mm වයර් (රෝල්) - වීථි පහන් සඳහා | 05 | - |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06ඃ01ඃ02 රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම.

i. සභාවේ ආරක්ෂිත කැමරා පද්ධතිය සේවා කිරීම වෙනුවෙන් PC System ආයතනය වෙත රු.18,600.00ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ii. RE 2600 ට්‍රැක්ටරයේ ස්ටීරියන් බොක්ස් එක අලුත්වැඩියා කිරීම (රේසර් දෙක, ඔයිල් සීල් එක, ජියර් ඔයිල් ලීටරය, ස්ටීරියන් බොක්ස් එක ගලවා අලුත්වැඩියා කර නැවත සවි කිරීම) වෙනුවෙන් තෙබුවන ගරාජ් වෙත රු. 13,250.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

iii. 226-7521 ටිපර් රථයේ Clutch Pump kit, Engine Water outlet අලුතින් දමා සවි කිරීම, රේඩියේටර් මූඩිය අලුතින් දැමීම, ජොයින්ට් ඇණ තද කිරීම යන අලුත්වැඩියා සිදු කිරීම වෙනුවෙන් නැෂනල් මෝටර්වේස් වෙත රු. 21,900.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

iv. RD 8000 ට්‍රැක්ටරයේ ක්ලච් ප්ලේට් එක, ක්ලච් රේසර්, ප්‍රයිවිල් රේසර්, ප්‍රෙෂර් ප්ලේට් දමා අලුත්වැඩියා කිරීම වෙනුවෙන් තෙබුවන ගරාජය වෙත රු. 54,500.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

v. 227-5020 ගලි බවුසරයේ පසුපස දුනු මිටිය ගලවා මේන් කොලය දමා බුෂ් 02 ක් ගසා සවි කිරීම, මේන් දුනු කොල 01 ක්, සෙන්ටර් බෝල්ට් 01ක්, කොලර් බුෂ් 02ක් දමා අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ලයන් ඉංජිනියරින් (යූ.බී.එල්. පීරිස්) වෙත රු. 12,150.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

vi. ND 5124 වෑන් රථය සඳහා 90 AMP බැටරියක් ලබා ගැනීම වෙනුවෙන් චමින්ද බැටරි මාට් ආයතනය වෙත රු.15,630.00ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

vii. PF 4006 කැබ් රථයේ Up Clutch Pump හා ඔයිල් දමා අලුත්වැඩියා කිරීම වෙනුවෙන් නැෂනල් මෝටර්වේස් ආයතනය වෙත රු. 17,450.00 ක මුදලක් ගෙවීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

viii. 227-5020 ගලි බවුසරයේ ඉදිරිපස හා පිටුපස බ්‍රේක් අලුත්වැඩියා කිරීම (බ්‍රේක් වොෂර්, බ්‍රේක් ලයිනර්,හබ් ඔයිල් සීල්, හබ් ග්‍රීස් සීල් අලුතින් දැමීම, උඩ මාස්ටර් පොම්පය ගලවා අලුත් මාස්ටර් පොම්පයක් දමා අලුත්වැඩියා කිරීම) වෙනුවෙන් තෙබුවන ගරාජ් වෙත රු. 58,610.00 මුදලක් ගෙවීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

ix. 227-5020 ගලි බවුසරය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් කේ.ජී.ඉංජිනියරින් ආයතනය වෙත රු.12,874.00ක මුදලක් ගෙවීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

x. පොදු වෙළඳසැල අංක 15,16 දරණ මස් කඩ, බළන්ගොඩ නගරයේ රථ වාහන නැවතුම් ගාස්තු අය කිරීම හා බළන්ගොඩ නගරයේ පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීම යන ක්ෂේත්‍රයන් ටෙන්ඩර් කිරීමට අදාල පුවත්පත් දැන්වීම් පළ කිරීම (දිනමිණ හා තිණකරන් පුවත්පත - 2021 - 10-26 පළ කරන ලද දැන්වීම්) වෙනුවෙන් ලේක්හවුස් ආයතනය වෙත රුපියල් 88,182.00 ක මුදලක් ගෙවීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

xi. 2021 ජූලි, අගෝස්තු හා සැප්තැම්බර් මාස සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත දායක මුදල වශයෙන් රු.36,530.91 ක මුදලක් ගෙවීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

xii. RC 8183 ට්‍රැක්ටර් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් රිෂානා සර්විස් ආයතනය වෙත රු.22,120.00ක මුදලක් ගෙවීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

xiii. 2021-11-09 වන දින මහ සභාවේ යෝජනා අංක 06:01:09 යටතේ අනුමත රු. 75,000.00 මුදල අනුව සහා පෙර පාසල් තුන සඳහා ත්‍යාග මිලදී ගැනීම (වතුර බෝතල් හා කෑම පෙට්ටි) වෙනුවෙන් ජෝති ස්ටෝර්ස් වෙත රු. 44,000.00 ක (බිල් අංකය 41392) මුදලක් ගෙවීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

xiv. බළන්ගොඩ නගර සභාවේ ඇඟිලි සලකුණු යන්ත්‍රය සඳහා වාර්ෂික නඩත්තු ගිවිසුම වෙනුවෙන් Ekrain Holding ආයතනය වෙත රු. 14,000.00 ක මුදලක් ගෙවීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:03 රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගැනීම.

| දිනය | විස්තරය | වවුචර් අංකය | චෙක්පත් අංකය | මුදල රු. |
|---|---|---|---|---|
| 2021-11-01 | විදු නැණ පියස හාර්ඩ් ඩිස්ක් සවි කිරිම වෙනුවෙන් PC system වෙත මුදල් ගෙවීම | 06 | 067037 | 14,400.00 |
| 2021-11-01 | ආයතන අංශයේ UPS අලුත් කිරීම වෙනුවෙන් විස්ඩම් කොම්පියුටර් වෙත මුදල් ගෙවීම | 07 | 067038 | 10,800.00 |
| 2021-11-01 | සෞඛ්‍ය අංශයට 32Gb පෙන් දෙකක් මිල දී ගැනීම වෙනුවෙන් විස්ඩම් කොම්පියුටර් වෙත මුදල් ගෙවීම | 08 | 067038 | 14,650.00 |
| 2021-11-01 | ඩයලොග් ඉන්ටර්නෙට් බිල් ගෙවීම (කාර්යාලය) | 17 | 067042 | 16,165.16 |
| 2021-11-01 | ඩයලොග් ක්ලවුඩ් බිල් ගෙවීම | 18 | 067042 | 15,660.00 |
| 2021-11-01 | ජේසීබී යන්ත්‍රය රක්ෂණය කිරීම වෙනුවෙන් අග්‍රහාර රක්ෂණ සමාගමට මුදල් ගෙවීම | 25 | 067045 | 14,593.50 |
| 2021-11-01 | ලංකා විදුලි බල මණ්ඩලය (අබිලි ද්‍රව්‍ය සඳහා) | 30 | 067047 | 10,461.00 |
| 2021-11-01 | බී.විනෝදනී ප්‍රේමිකා - 2021-10-16 සිට 2021-10-30 දක්වා කසළ ඉවත් කිරීම වෙනුවෙන් ගෙවීම | 31 | 067048 | 310,423.00 |
| 2021-11-01 | (හෝරස්ථම්භය, සම්පත් පියස, බැංකියවත්ත, වැවවත්ත, පොදු වෙළඳසැල, වැසිකිළි,ප්‍රේක්ෂකාගාරය) විදුලි බිල් ගෙවීම | 34 | 067049 | 18,921.35 |
| 2021-11-01 | සුහද වැඩිහිටි සමිතිය (මිරිස්වත්ත පාර පැති කාණු කර්මාන්තයේ රැඳවුම් ගෙවීම) | 36 | 081951 | 47,975.00 |
| 2021-11-01 | ගැමුණු එක්සත් අවමංගල්‍යාධාර සමිතිය ( කුමාරගම විජයානන්ද මහතාගේ නිවස අසල බෝක්කුව - රැඳවුම් ගාස්තු ගෙවීම) | 37 | 081952 | 13,546.15 |
| 2021-11-01 | ගැමුණු එක්සත් අවමංගල්‍යාධාර සමිතිය ( මහමෙව්නාව මාවත පැතිබැම්ම - රැඳවුම් ගාස්තු ගෙවීම) | 38 | 081953 | 1,539,389.24 |
| 2021-11-09 | සුසාන භූමි නඩත්තු දීමනා | 46 | 081967 | 20,000.00 |
| 2021-11-09 | දෛනික වැටුප් (සම්පත් පියස) | 47 | 081967 | 17,550.00 |
| 2021-11-09 | දෛනික වැටුප් (පොලිතින් තේරීම) | 48 | 081968 | 58,700.00 |
| 2021-11-09 | පෙර පාසල් දීමනා | 55 | 081974 | 30,000.00 |
| 2021-11-17 | ලංකා විදුලි බල මණ්ඩලය (කාර්යාලය, නගර සභා යාබද ගොඩනැගිල්ල) | 72 | 081988 | 13,688.00 |
| 2021-11-17 | ලංකා විදුලි බල මණ්ඩලය (ආයුර්වේදය, මහජන පොළ, මුර කුටිය) | 75 | 081981 | 28,500.20 |
| 2021-11-17 | සී/ ස ඉඹුල්පේ විවිධ සේවා සමූපකාර සමිතිය ඉන්ධන බිල්පත් ගෙවීම | 76-78 | 081992 | 167,041.40 |

| | | | | |
|---|---|---|---|---|
| 2021-11-23 | සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම(පොදු වැසිකිළි නඩත්තුවලට අදාලව දිනමිණ හා තිණකරන් පුවත්පත්වල දැන්වීම් පළ කිරීම) | 95 | 082003 | 121,230.00 |
| 2021-11-23 | බී. ඩබ්. සිරියලතා (ටෙන්ඩර් ඇප තැන්පත්) | 109 | 082002 | 12,500.00 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:04 2022 ජනවාරි මස සභාවේ ගරු සභිකරුන්ගේ දීමනාව ලෙස රු.270,000.00 ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:05 2021-12-10 දින සිට 2022 ජනවාරි මස සභාව පැවැත්වෙන දින දක්වා සෞඛ්‍ය සේවා සඳහා වියදම් ඇස්තමේන්තුව වන රු. 159,850.00 ක මුදල සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

(2021-11-08 දින සිට 2021-12-03 දක්වා වියදම රු. 49,224.00)

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, සෞඛ්‍ය සේවා වියදම් ඇස්තමේන්තුව සඳහා විශාල මුදලක් ඇතුලත්ව ඇත්තේ ඇයි දැයි විමසන ලදී.

මේ සඳහා පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා පැවසූවේ බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවකයන් සඳහා බෝ නොවන රෝග සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයන් වාර්ෂිකව සිදු කරන අතර, එම වෛද්‍ය සායන සඳහා රුපියල් ලක්ෂයක මුදලක් මෙහි අන්තර්ගත කර ඇති බවයි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:06 2021 දෙසැම්බර් මස සභාවේ නිළධාරීන්ගේ අතිකාල හා ගමන් වියදම් ඇස්තමේන්තුව සඳහා රු300,000.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.
(2021 නොවැම්බර් මස අතිකාල හා ගමන් වියදම් රු. 139,265.04 )
ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:07 2021-12-10 දින සිට 2022 ජනවාරි මස සභාව පැවැත්වෙන දින දක්වා සභාවේ සංග්‍රහ වියදම් ලෙස රු.50,000.00 ක මුදලක් වියදම් දැරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

(2021 නොවැම්බර් මස සභාවේ සංග්‍රහ වියදම් රු. 25,061.00)

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:08 2021-12-10 දින සිට 2022 ජනවාරි මස සභාව පැවැත්වෙන දින දක්වා සභාවේ වාහනවල හදිසි අලුත්වැඩියා කටයුතු සඳහා රු.300,000.00 මුදලක් වියදම් කිරීම හා ඒ සඳහා ආවරණ අනුමැතියට යටත්ව මුදල් ගෙවීම වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම.

(2021 නොවැම්බර් මස සභාවේ හදිසි අලුත්වැඩියා කටයුතු සඳහා වියදම රු.193,490.00ක් වන අතර, පහත සඳහන් අලුත්වැඩියාවන් සිදු කරන ලදී.)

- RE 2600 ට්‍රැක්ටරයේ ස්ටීරියන් බොක්ස් එක අලුත්වැඩියා කිරීම (රේසර් දෙක, ඔයිල් සීල් එක, ජියර් ඔයිල් ලීටරය, ස්ටීරියන් බොක්ස් එක ගලවා අලුත්වැඩියා කර නැවත සවි කිරීම) වෙනුවෙන් තෙබුවන ගරාජ් වෙත රු. 13,250.00
- 226-7521 ටිපර් රථයේ Clutch Pump kit, Engine Water outlet අලුතින් දමා සවි කිරීම, රේඩියේටර් මූඩිය අලුතින් දැමීම, ජොයින්ට් ඇණ තද කිරීම යන අලුත්වැඩියා සිදු කිරීම වෙනුවෙන් නැෂනල් මෝටර්වේස් වෙත රු. 21,900.00
- RD 8000 ට්‍රැක්ටරයේ ක්ලච් ප්ලේට් එක, ක්ලච් රේසර්, ප්‍රයිවිල් රේසර්, ප්‍රෙෂර් ප්ලේට් දමා අලුත්වැඩියා කිරීම වෙනුවෙන් තෙබුවන ගරාජය වෙත රු. 54,500.00
- 227-5020 ගලි බවුසරයේ පසුපස දුනු මිටිය ගලවා මේන් කොලය දමා බුෂ් 02 ක් ගසා සවි කිරීම, මේන් දුනු කොල 01 ක්, සෙන්ටර් බෝල්ට් 01ක්, කොලර් බුෂ් 02ක් දමා අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ලයන් ඉංජිනියරින් (යූ.බී.එල්. පීරිස්) වෙත රු. 12,150.00
- ND 5124 වෑන් රථය සඳහා 90 AMP බැටරියක් ලබා ගැනීම වෙනුවෙන් චමින්ද බැටරි මාට් ආයතනය වෙත රු.15,630.00
- PF 4006 කැබ් රථයේ Up Clutch Pump හා ඔයිල් දමා අලුත්වැඩියා කිරීම වෙනුවෙන් නැෂනල් මෝටර්වේස් ආයතනය වෙත රු. 17,450.00
- 227-5020 ගලි බවුසරයේ ඉදිරිපස හා පිටුපස බ්‍රේක් අලුත්වැඩියා කිරීම (බ්‍රේක් වොෂර්, බ්‍රේක් ලයිනර්,හබ් ඔයිල් සීල්, හබ් ග්‍රීස් සීල් අලුතින් දැමීම, උඩ මාස්ටර් පොම්පය ගලවා අලුත් මාස්ටර් පොම්පයක් දමා අලුත්වැඩියා කිරීම) වෙනුවෙන් තෙබුවන ගරාජ් වෙත රු. 58,610.00

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:09 2021-12-10 දින සිට 2022 ජනවාරි මස සභාව පැවැත්වෙන දින දක්වා සභාවේ යන්ත්‍ර සූත්‍රවල හදිසි අලුත්වැඩියා කටයුතු සඳහා රු.75,000.00 ක මුදලක් වියදම් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

(2021 නොවැම්බර් මස සභාවේ යන්ත්‍ර සූත්‍රවල හදිසි අලුත්වැඩියා කටයුතු සඳහා වියදම් නොවුණි)

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:10 2022 ජනවාරි මස ගෙවිය යුතු දේශීය ණය සහ සංවර්ධන අරමුදල මඟින් බස්නැවතුම්පල සහිත වෙළෙඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා ලබා ගත් ණය වාරිකය ලෙස රු.769,680.36 මුදලක් ද, වැසි ජල කාණු පද්ධතිය ඉදි කිරීම වෙනුවෙන් ලබා ගත් ණය වාරිකය ලෙස රු.202,918.84 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:11 2021 දෙසැම්බර් මාසය සඳහා කාර්යසාධන ණය රු. 800,000.00 කට යටත්ව ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:12 2022 වර්ෂයේ පහත සඳහන් ක්ෂේත්‍රයන්ට අදාල වාර්ෂික සැලසුම් සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- ප්‍රසම්පාදන සැලැස්ම
- වට රවුම් නඩත්තු සැලැස්ම
- යන්ත්‍ර/උපකරණ ප්‍රසම්පාදන සැලැස්ම
- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම
- වීථි පහන් නඩත්තු සැලැස්ම
- වැසිජල කාණු නඩත්තු සැලැස්ම
- ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම ( සෞඛ්‍යය කම්කරුවන් 25 දෙනෙකුගේ සේවය මාසිකව මිලදී ගැනීමට අනුමැතිය ලබා ගැනීම)
- වීථි ඇමදීමේ සැලැස්ම
- අභ්‍යන්තර විගණන සැලැස්ම
- ආයතනයේ ගෙවීම් සම්බන්ධ මු.රෙ. 83 යටතේ නිලධාරීන්ට බලතල පැවරීම

- නගරය පිරිසිදු කිරීම කුණු කසළ එකතු කිරීම, බැහැර කිරීම හා ප්‍රවාහනය කිරීම සඳහා දෛනිකව කම්කරුවන්ගේ සේවය මිළදී ගැනීමට අනුමැතිය ලබා ගැනීම.
- රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2012 ප්‍රකාරව කර්මාන්තය ප්‍රජා පාදක සංවිධානවලට පිරිනැමීමේදී නගර සභාවේ සභාපතිවරයා, බළන්ගොඩ නගර සභාවේ වැඩ අධිකාරී සහ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම්කරනු ලබන එක් නියෝජිතයෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.
- කර්මාන්ත ලබා දීමේ ගිවිසුම් කෙටුම්පත සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.
- කර්මාන්ත අංශයේ නඩත්තු වැඩසටහන, මාර්ග නඩත්තු වැඩසටහන අනුමත කිරීම ( 2022 වර්ෂය සඳහා කම්කරුවන් 25 දෙනෙකුගේ සේවය මාසිකව මිලදී ගැනීමට අනුමැතිය ලබා ගැනීම)
- වාර්ෂික පුහුණු සැලැස්ම
- 2022 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ලේඛනය

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:13 2022 වර්ෂයට අදාලව සභාව පවත්වන දිනය තීරණය කිරීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

2022 වර්ෂයට අදාලව මහ සභාව සෑම මාසයකම දෙවන අඟහරුවාදා පැවැත්වීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:14 2022 වර්ෂය සඳහා පහත නම් සඳහන් සේවකයන්ගේ සේවා ගිවිසුම් අලුත් කිරීමටත්, ඔවුන් නැවත සේවය සඳහා බඳවා ගැනීමටත් සභා අනුමැතිය ලබා ගැනීම

01. එම්.ඩී.ජයන්ති පෙරේරා
02. ආර්. මංගලේෂ්වරි
03. ඒ. තමිල් සෙල්වි
04. අයි. ජයරාම්
05. ඩබ්. එල්. චන්ද්‍රසිරි තිලකරත්න
06. පී.ආර්. ශ්‍යාමා
07. එන්. හේමන්ති
08. යූ.ඩී.සුගත් කුමාර
09. කේ.පී.කුසුමලතා
10. කේ. තිල්මිණි ජයරත්න
11. තුසිත ප්‍රසන්න රත්නායක
12. එම්. රොෂාන් ප්‍රනාන්දු
13. එම්. සමීර අරවින්ද ඉන්ද්‍රසිරි
14. පී. කනගරාජා
15. ටී.ඩී.සන්ධ්‍යානි
16. එච්.එම්.අනුර ප්‍රේමකුමාර
17. ආර්.කේ.ඩී.නිලන්ති
18. බී.ආර්.ලාල් ගුණරත්න
19. වයි.ඩී.සුදත් සංජය කුමාර
20. එම්.ඩබ්. ඉරෝෂන් හේමන්ත
21. ටී. ඒ. ප්‍රේමසිරි
22. කේ. ජයකොඩි
23. ටී. සුබ්‍රමනියම්
24. බී.ආර්. කරුණාදාස
25. එන්. බී. ගුණපාල
26. කේ. එච්. නිමලදාස
27. කේ. එම්.සම්පත් විජයබණ්ඩාර
28. යූ.එම්.උපාලි මුණසිංහ
29. ආර්.ජයසුන්දර
30. ඩී.ජේ. උපුල් ශාන්ත
31. ජී. දයාරත්න
32. ඩබ්. ඒ. සමරදාස

33. ආර්. ජී.ජයතිලක
34. ඩබ්.ඩබ්. ෂෙල්ටන් පීරිස්
35. ඒ. එම්. අජිත් ප්‍රියශාන්ත
36. කේ.ඒ.සී. ලක්රුවන් බණ්ඩාර

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:15 බෝම්බුව නගර සභා පෙර පාසලේ දීමනා මත සේවය කළ කේ. රුවිනි නිරුක්ෂිකා මහත්මිය ඉල්ලා අස් වූ බැවින් එම පෙර පාසල සඳහා ශ්‍යාමා සිරිනි ශාන්ති මිය යෙදවීමටත්, සේවා ගිවිසුම් සකස් කිරීමටත් සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:16 2022 ජනවාරි සිට ඉදිරි වසරක කාලය සඳහා සභාව සතු වාහන අදාල මීටර පැය ගණන සම්පූර්ණ වූ පසු සේවා කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:17 HF 7899 JCB යන්ත්‍රයේ එන්ජිම, ජියරය, පවර් ස්ටීරියන් ජැක්, පසුපස ස්කැවේටර් යන්ත්‍රයේ ස්විම් ජැක් යන කොටස්වලින් ඔයිල් යන බැවින් පරීක්ෂා කර බලා අලුත්වැඩියා කිරීම, පවර් ස්ටීරියන් එකේ රේසරය දැමීම, පසුපස බකට් එකෙහි කැඩී ඇති ස්ථාන සෑදීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:18 RC 1107 ට්‍රැක්ටර් රථයේ එන්ජිමෙහි තෙල් කාන්දු වීම හා ස්ටාටර් මෝටරය අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍ර එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:19 සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී වෙත බලය පැවරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ නගර සභා සීමාව තුළ මහජන සෞඛ්‍ය ක්‍රියාත්මක කිරීමේ පොදු අධිකාරිය බළන්ගොඩ නගර සභාව වන හෙයින් ද එම අධිකාරී බලය ක්‍රියාත්මක කිරීමෙහි ලා කටයුතු කිරීමේ දී සෞඛ්‍ය වෛද්‍ය නිළධාරීගෙන් විමසා කටයුතු කළ යුතු හෙයින් ද විවිධ ආඥා පනත්, හා වෙනත් යම් ලිඛිත නීති යටතේ සභාපතිවරයා වෙත පිරිනැමී ඇති බලතල පවරා දීම සභාවේ යම් නිළධාරියෙකු වෙත පමණක් කළ හැකි වන හෙයින් ද බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශයට අදාල වන සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී හා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු සභාවේ කාර්ය මණ්ඩලය ලෙස සලකා කටයුතු කිරීමටත් එකී බලතල ක්‍රියාත්මක කිරීමේ නිළධාරී ලෙස සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී වෙත බලය පැවරීමටත් යෝජනා කරන බව පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:20 පුස්තකාලයාධිපති තනතුර පුරප්පාඩුව පවතින බැවින් එම පුරප්පාඩුව සම්පූර්ණ වනතුරු පුස්තකාලයාධිපති තනතුරෙහි වැඩ බැලීම සඳහා පුස්තකාල සහයක සේවයේ නියුතු උමුදුනී විදානපතිරණ මිය වෙත බලය පැවරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:21 පහත සඳහන් ගිවිසුම් කෙටුම්පත් සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- සභාව සතු දේපල
- සම්පත් පියසට යාබද කඩ කාමරය

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:22 2022-01-22 දින විශ්‍රාම යාමට නියමිත බී.ආර්. කුසුමා මහත්මිය ආදේශක සෞඛ්‍ය කම්කරු තනතුරෙහි සේවය කර ඇති අතර, 2014-04-01 දින සිට ස්ථිර පත්වීම් ලබා ඇත. එබැවින් සේවක අර්ථසාධක අරමුදලෙන් 1-0-362 ආදායම් ශීර්ෂය යටතේ තැන්පත් කළ 60% ක ප්‍රමාණය වන රු. 347,121.24 ක මුදල ආදායමෙන් ආපසු ගෙවීමක් ලෙස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:23 කාර්යසාධන ණය පියවීම සඳහා වැඩිපුර අය වී ඇති වාරික මුදල් වන රු. 4,342.00 ක මුදල නැවත ඩබ්.ඩබ්. ෂෙල්ටන් පීරිස් යන අය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:24 2021 වාර්ෂික අයවැය මඟින් මාතෘ හා ළමා සංරක්ෂණය සඳහා වෙන් කර ඇති මුදලින් පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා ලිපි ද්‍රව්‍ය ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:25 2021 වාර්ෂික අයවැය මඟින් මාතෘ හා ළමා පෝෂණය සඳහා වෙන් කර ඇති මුදලින් බළන්ගොඩ නගර සීමාව තුල සිටින අඩු බර දරුවන් සඳහා පෝෂණ මල්ලක් ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:26 2021-12-01 දින රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ ලිපිය අනුව අංක 09 හා අංක 10 හැර ඉතිරි කඩ කාමර සඳහා නව තක්සේරුව ක්‍රියාත්මක කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:27 පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ 2021-11-20 දිනැති ලිපියට අනුව 2022 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී පාසල්වල පිරිසිදු පානීය ජලය හා වැසිකිළි හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා සහයෝගය දැක්විය හැකි යෝජනා ඇත්නම්, එම යෝජනා ලබා ගැනීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දක්වූ ගරු සභාපතිතුමා, මෙහි අරමුණ වී ඇත්තේ පිරිසිදු පානීය ජලය, වැසිකිළි හා සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සඳහා සංවර්ධන කටයුතුවල දී දායක විය හැකි නම් ඒ සඳහා අනුමැතිය ලබා ගැනීම බවයි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:28 ආර්.පී.ඒ.පී.වීරකෝන් යන අයට බළන්ගොඩ බස්නැවතුම්පළ ගුවන් පාලම යට යෝජිත පැන්තාලිය ඉදි කරන ස්ථානයට පිටුපස හිස් ඉඩ කොටසෙහි ස්වයං රැකියා සම්මේලනය මඟින් ලබා දුන් වෙළඳ කුටියක් තැබීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දැක් වූ ගරු සභාපතිතුමා, මෙම ස්ථානය කිසිම කෙනෙකුට ලබා නොදීමට හෝ අඩු ආදායම්ලාභී පදනම මත සභාවෙන් යෝජනා වන ක්‍රමවේදයක් අනුව ලබා දීම යන කරුණු අනුව ස්ථානය අවලස්සන නොවන පරිදි ලබා දීමට හැකි බව ද ආරවුල් ඇති විය හැකි බැවින් මෙම ස්ථානය දැනට ලබා නොදීම සුදුසු බව ද පවසන ලදී.

06:01:29 බළන්ගොඩ, බලගහමුල සම්පත් පියස ස්ථානයේ පවතින කඩ කාමරය මාසික කුලී පදනම මත එස්. කේ. එම්කා රෝෂනී ද සිල්වා යන අය වෙත මල් වෙළඳාම සඳහා ලබා දීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මෙම ස්ථානයේ වෙළඳාම් කටයුතු සිදු කරන පුද්ගලයා ඉවත් කර වෙනත් අයෙකුට ලබා දෙන්නේ නම් ඒ සඳහා නිසි ක්‍රමවේදයක් තිබිය යුතු බව පැවසීය.

මේ සම්බන්ධව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා, 2015 වර්ෂය වන තුරු එක් පුද්ගලයෙකු මෙම ස්ථානයේ කැඳ විකුණූ අතර, අසනීප තත්ත්වයක් හේතුවෙන් වෙළඳාමේ නිරත වීමට නොහැකි වීම නිසා කමිටු තීරණයක් මත රු. 1,500.00 ක මාසික කුලියක් අය කරගෙන ඩේවිඩ් යන අයට මෙම කඩ කාමරය ලබා දුන් බව ද එම කාලයේ සභාව නොපැවතුණු අතර, 2019 වර්ෂයේ දී එම මුදල වැට් බදු සමඟ රු. 3,000.00 දක්වා වැඩි කළ නමුත් වර්තමානයේ වැට් ඉවත් කර රු.2,777.78 ක මුදලකට ලබා දී ඇති බව පවසන ලදී. එමෙන්ම පසුගිය අවුරුද්දක මෙම කඩ කාමරය ඩේවිඩ් යන අයට ලබා දෙන බව ගරු සභාපතිතුමා පැවසූ අවස්ථාවේ දී තමන් නිහඬව සිටි බව ද ඉන්පසුව කැඳ විකුණූ පුද්ගලයා තමන්ගේ අසනීප තත්ත්වය සුව වී ඇති බව පවසා මෙම කඩ කාමරය ලබා දෙන ලෙස තමන්ගෙන් ඉල්ලීමක් කළ අතර, එය සභාවට ඉදිරිපත් කළ නමුත් ඒ පිළිබඳව සාකච්ඡා නොකර ඩේවිඩ් යන අයටම ලබා දුන් බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා, ලබන වසරේ බදු ලබා දෙන කඩ කාමර යටතට මෙම කඩ කාමරය ඇතුලත්ව නොමැති වීම නිසා ඉහත නම් සඳහන් අයගේ ලිපිය ලබා දුන් බව ද එම අවස්ථාවේ දී ටෙන්ඩර් කරන බව පැවසූ අතර මස් කඩ ටෙන්ඩර් කිරීමට මිල ගණන් සාකච්ඡා කළ අවස්ථාවේ දී මේ සම්බන්ධව මිල ගණන් ඉදිරිපත් කිරීමට හැකිව තිබූ නමුත් එය එසේ නොකළ බව ද පවසන ලදී.

එමෙන්ම මල් වෙළඳාම සඳහා මෙම කඩය ලබා දෙන ලෙස පැවසූවේ සානුකම්පිතව සලකා බලා බව ද ජීවනෝපාය මාර්ග ව්‍යාපෘතිය යටතේ රු. 15,000.00 ක පමණ වටිනාකමකින් යුත්

මල් පෝච්චි ඇතුළු ද්‍රව්‍ය ලැබෙන නමුත් වෙළඳාම සඳහා ස්ථානයක් නොමැති බැවින් හා මෙම කඩය වසා තිබූ නිසා ඉල්ලීමක් කළ අතර, සාධාරණ කුලියකට ලබා දෙන ලෙස ද අවශ්‍ය නම් බෙදීමකට යා හැකි බව ද පැවසීය.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා සඳහන් කළ කාරණා අනුව එතුමාගේ මට්ටමින් තමන්ව මැනීම පිළිබඳව කණගාටුවට පත්වන බව ද ඩේවිඩ් යන අය සමඟ තමන්ගේ සම්බන්ධයක් නොමැති අතර, තම රාජකාරිය පොදුවේ සියලුම දෙනාට සාධාරණව කරන බව ද පසුගිය සභාවේ දී පැවසූ පරිදි පලකයක් වසා කඩයක් ඉදි කිරීම නිසා සභාවේ ගොඩනැගිලි ලේඛනවල මෙය ඇතුලත් වී නොතිබෙන්නට ඇති බව ද සභාවේ සියලුම මන්ත්‍රී හා මන්ත්‍රීවරියන්ගේ සහභාගිත්වයෙන් සානුකම්පිතව බලා සෑම අවස්ථාවකම කටයුතු කරන අතර, කාලයක් ඇවෑමෙන් එය අමතක කර අවසන් ප්‍රතිඵලය පිළිබඳව පමණක් සලකා සියල්ල විග්‍රහ කිරීම වැරදි බව ද සභිකයන් විසින් තම සේවය ජනතාවට ලබා දීමේ දී අවශ්‍ය කරන සහයෝගය අදාල නිළධාරීන් සම්බන්ධ කර දෙමින් සෑම අවස්ථාවක දීම උපරිම සාධාරණව හා නීත්‍යානුකූලව සිදු කරන බව ද මෙම කඩ කාමරය සඳහා තක්සේරුවක් ලබා ගැනීමට කටයුතු කරන ලෙස ලේකම්තුමියට පැවසූ ගරු සභාපතිතුමා, එම තක්සේරුව ලබාගෙන රජයේ චක්‍රලේඛ අනුව ටෙන්ඩර් කර, ටෙන්ඩර් ක්‍රමවේදය මඟින් අවශ්‍ය පුද්ගලයන්ට ගැනීමට හැකි වන බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් ගරු සභාපතිතුමන් විසින් ටෙන්ඩර් කරන ලෙස ලේකම්තුමියට නියෝගයක් කිරීම සම්බන්ධව කණගාටුවට පත් වන බව ද තනි තීරණ මත කටයුතු කළ නොහැකි අතර, සභාවේ බහුතර කැමැත්තෙන් අවශ්‍ය කටයුතු කරන ලෙස ද පැවසීය. එමෙන්ම ඩේවිඩ් යන අය තමන්ට කතා කර පසුගිය කාලයේ මුදල් ගෙවීමට නොහැකි වූ බව පැවසූ බැවින් මෙම කඩ කාමරය සම්බන්ධ කොන්දේසි කඩ වී ඇත්දැයි විමසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා පැවසූවේ පසුගිය කාලයේ දී ආණ්ඩුකාරතුමා චක්‍රලේඛයක් එවා ඇති අතර, එහි ස්ව කැමැත්තෙන් ඉවත් වුවහොත් මිස ගිවිසුම් කොන්දේසි කඩ කර ඇත්නම් පමණක් ඉවත් කළ යුතු බව සඳහන්ව ඇති බවයි.

මේ සම්බන්ධව අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා, මෙම ඩේවිඩ් යන අයගේ මව අසනීපෙන් සිටි බැවින් හා කොරෝනා වසංගතය හේතුවෙන් කඩය පවත්වාගෙන යාමට නොහැකිවන්නට ඇති බව ද එම කාලය තුල ආදායමක් නොලැබුණු බැවින් කුලිය ගෙවීමට නොහැකි වූ බව තමන්ට පැවසූ බව ද ගිවිසුම් කොන්දේසි කඩ කිරීමක් සිදුව ඇත්නම් මිස ඔහුගෙන් කඩ කාමරය ලබාගෙන වෙනත් අයෙකුට දීම සඳහා තමන් විරුද්ධ බව ද ඔහු අහිංසක පුද්ගලයෙක් බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්. පී.ගුණරත්න මැතිතුමා මෙම කඩ කාමරය සම්බන්ධ කොන්දේසි කඩ වී ඇත්දැයි කරන ලද විමසීමට අනුව ලේකම්තුමියගෙන් අදාල කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමා පැවසුවේ ගිවිසුම් කොන්දේසි කඩ වී ඇති බැවින් මෙම කඩ කාමරය නගර සභාවට පවරාගෙන සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කිරීමට සභාවේ තීරණයක් ගන්නා ලෙසයි. ඒ අනුව ක්‍රම කීපයක් පවතින බව ද තක්සේරු කර ටෙන්ඩර් කිරීමට හෝ තක්සේරු කර එම තක්සේරු මුදලට ලබා ගැනීමට කැමති අයෙකුට සභාවේ එකඟතාවයකින් ලබා දීම ඒ අතර වන බව ද පැවසීය.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා පැවසුවේ දැනට පවතින මුදල සාධාරණ ලෙස වැඩි කර වාර්ෂිකව ලබා දෙන ලෙසයි.

මේ සම්බන්ධව පැවති දීර්ඝ සාකච්ඡාවකින් අනතුරුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් සම්පත් පියසා යාබද කඩ කාමරය ස්වයං රැකියාවක් සඳහා ලබා දෙන ලෙස පසුගිය සභාවේ දී ඉල්ලීමක් ලැබුණු අතර, ගරු සභාපතිතුමා විසින් ඒ සම්බන්ධව සොයා බලා මෙවර සභාවට ඉදිරිපත් කරන බව පැවසූ බව ද ඒ අනුව එය මෙම සභාවේ න්‍යාය පත්‍රයට ඇතුලත් කර ඇති අතර, අද දින ඩේවිඩ් යන අය ගිවිසුම් කොන්දේසි කඩ කර ඇති බව අනාවරණය වූ බැවින් ඔහුගෙන් එම කඩය පවරාගෙන මෙම ඉල්ලීම කරන අය වෙත මාසික කුලියක් අය කරගෙන ස්වයං රැකියාවක් සඳහා ලබා දීම සුදුසු ද නුසුදුසු ද යන්න පිළිබඳව ගරු සභාවේ කැමැත්ත අකමැත්ත විමසන ලෙස යෝජනා කරන බව පැවසීය.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා අදහස් දක්වමින් සභාව සතු දේපලවල දී ගිවිසුම් කඩ කිරීමක් කර ඇත්තේ මෙම කඩය පමණක් ද? නැත්නම් තව තියෙනව ද? තවත් අයෙක් කඩයක් ඉල්ලගෙන පැමිණියහොත් මේ ආකාරයට ලබා දෙනවා ද? යන්න විමසීය.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් ඉතිරි කඩ සම්බන්ධයෙන් පවතින ගිවිසුම් කොන්දේසි කඩ වී ඇත්දැයි පරීක්ෂා කර බලන බවත්, වාසිය අවාසිය නොබලා පොදු ක්‍රමවේදයකට යා යුතු බවත් පැවසීය.

ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය, ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා ඩේවිඩ් යන අයට හිඟ කුලිය ගෙවීම සඳහා දින 07 ක කාලයක් ලබා දී අනතුරුව කඩය පවරා ගැනීම සුදුසු බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා ධම්ම පදයේ ගාථාවක් වන "මනෝ පුබ්බං ගමා ධම්මා" ගාථාව පවසමින් කරත්තයේ රෝද දෙක ගොනා පසුපස එන්නා සේ අප කරන පව් පින්

අප පසුපස පැමිණෙන බැවින් හෘද සාක්ෂියට එකගව සාධාරණයක් කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

ගරු සභාපතිතුමා, මෙම කඩය සභාවට පවරගෙන නීත්‍යානුකූලව කෙනෙකුට ලබා දීම හා හිග කුලිය ගෙවීමට දින 14 ක සහන කාලයක් ලබා දීම යන කරුණු දෙක සම්බන්ධයෙන් බෙදීමකට යාම සුදුසු බව පැවසීය.

දීර්ඝ සාකච්ඡාවකින් අනතුරුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා පැවසුවේ මෙම ප්‍රශ්නය තමන් විසින් ගෙන ආ බැවින් ඩේවිඩ් යන අයට දින 07 ක් තුල ගෙවීමට කාලය ලබා දීම සඳහා එකග වන බවයි.

ඒ අනුව ගරු සභාපතිතුමා, වැඩ කරන දින 07ක් තුළ අදාල හිග මුදල් ගෙවන ලෙසත්, ගෙවීමට අපොහොසත් වන්නේ නම් කඩ කාමරය සභාවට පවරා ගන්නා බවත් දන්වමින් ජේ. ඩේවිඩ් යන අයට ලිපියකින් දැනුම් දීමට යෝජනා කළ අතර, එම යෝජනාව කේ.ජී. ප්‍රේමදාස මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:30 පාස්කු ප්‍රහාරය හා කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් නිරන්තරව වසා දැමීමට සිදු වූ බළන්ගොඩ තානයමේ ව්‍යාපාර කටයුතු අඩාල වූ අතර, 2022-02-28 දිනෙන් අවසන් වන එහි ටෙන්ඩර් කාලය 2024-02-28 දින දක්වා දීර්ඝ කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දක් වූ ගරු නාගරික මන්ත්‍රී ඊ.එම්.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා, බළන්ගොඩ තානායමෙහි විවාහ මංගල උත්සව සඳහා අත්තිකාරම් ලබා ගෙන ඇති නමුත් කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් එම විවාහ මංගල උත්සව ලබන වසර දක්වා කල් යාම නිසා එම මුදල් නැවත ගෙවීමට අපොහොසත් වී ඇති බැවින් ටෙන්ඩර් කාලය දීර්ඝ කර දෙන ලෙස ඉල්ලා ඇති බව පැවසීය.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් තානායම වසා තැබූ කාල සීමාව තුළ ලබා දිය හැකි සියලුම සහන ලබා දී ඇති බව ද රජයේ පිළිගත් පොදු චක්‍රලේඛ නීතිවලට අනුව කටයුතු කළ යුතු බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා අදහස් දක්වමින් නියමිත කාලසීමාවේ දී ටෙන්ඩර් කිරීම අනෙකුත් සේවා සඳහා ද සිදු වන බැවින් ටෙන්ඩර් කළ යුතු නේදැයි විමසූ අතර, අත්තිකාරම් ලබා ගැනීම සභාවේ ගැටලුවක් නොවන බව පැවසීය.

මේ සම්බන්ධව කේ.ජී.පේමදාස මැතිතුමා අදහස් දක්වමින් පසුගිය සභාවේ දී තමන් විසින් පැවසූ පරිදි විවාහ මංගල උත්සව ලබන වසර දක්වා කල් යාම නිසා එම මුදල් නැවත ගෙවීමට නොහැකි වී ඇති බව පවසන ලදී.

මෙහි දී ගරු සභාපතිතුමා පැවසූවේ ටෙන්ඩර් කාල සීමාව අවසානයේ දී ටෙන්ඩර් විය යුතු අතර, එසේ නොමැති වුවහොත් ටෙන්ඩර් කරනු ලබන අනෙකුත් ක්ෂේත්‍රයන්ගෙන් ද මෙවැනි ඉල්ලීම් ලැබිය හැකි බවත් අත්තිකාරම් ලබා ගත් ප්‍රමාණය හා මුදල කොපමණදැයි බලා තානායම සභාවට පවරා ගත් පසු ටෙන්ඩර් තැන්පත් මුදලින් එම අත්තිකාරම් මුදල් හිලව් කරගෙන තානායම අලුත්වැඩියා කිරීමෙන් පසු නැවත ටෙන්ඩර් කිරීම සුදුසු බවත් ය.

06:01:31 මහජන පොළ තනි මහලට සකස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා, මේ සම්බන්ධව පැහැදිලි කිරීමක් කරන ලෙස පැවසීය.

ඒ අනුව ගරු සභාපතිතුමා අදහස් දක්වමින් නගර සභාවට ලැබුණු ව්‍යාපෘති 03 ක් නතර වූ බව ද ගොඩකවෙල මහජන පොළ තනි වහලයට සකස් කිරීම නිසා වටිනාකමක් එකතු වී ඇති බැවින් තමන් මේ සම්බන්ධව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමා සමඟ සාකච්ඡා කළ බව ද එහි දී මහජන පොළ තනි මහලට සකස් කිරීම, හදිසි අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමෙන් අක්කර 01 ක ප්‍රමාණයක් ලබා ගැනීම හා රථ වාහන නැවතුම් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමෙන් අක්කර 01 ක ප්‍රමාණයක් ලබා ගැනීම යන කාරණා තුන සඳහා සභා අනුමැතිය ලබාගෙන සම්බන්ධීකරණ කමිටුවට යොමු කරන ලෙසත් ඉන්පසු ඉදිරි කටයුතු සිදු කිරීම පහසු බවටත් අවශ්‍ය උපදෙස් ලබා දුන් බව ද ඒ අනුව මෙම යෝජනා න්‍යාය පත්‍රයට ඇතුලත් කළ බවද මහජන පොළ තනි වහලයකට සකස් කිරීම මත රථවාහන නැවතුම් ස්ථාන ගැටලුව 25% ක් පමණ විසඳෙන බව ද පවසන ලදී.

එමෙන්ම තනි වහලයකට සකස් කිරීම මඟින් සති පොළ සඳහා පමණක් වෙන් වූ මෙම ස්ථානය සෑම දිනකම ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි සකස් වන බව ද විශේෂයෙන් සභා ආදායම වර්ධනය කර ගැනීමට හැකි වන අතර, පිරිසිදුව පවත්වා ගැනීමට ද හැකි වන බව වැඩිදුරටත් පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් සාමාන්‍යයෙන් සභාවට පැමිණීමට පෙර ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා සමඟ න්‍යාය පත්‍රය පිළිබඳව සාකච්ඡා කිරීමේ දී මේ සම්බන්ධව කිසිවක් නොකියූ බව ද එතුමා සහ නාගරික සංවර්ධන අධිකාරිය සමඟ පැවති සාකච්ඡාව සඳහා ගරු සභාපතිතුමා ද සහභාගී වූ අතර, එම අවස්ථාවේ දී මේ පිළිබඳව කිසිවක් නොකියූ බව ද පැවසීය. එබැවින් මහජන පොළ තනි මහලට සකස් කිරීම, හදිසි අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමෙන් අක්කර 01 ක ප්‍රමාණයක් ලබා ගැනීම හා රථ වාහන නැවතුම් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමෙන් අක්කර 01 ක ප්‍රමාණයක් ලබා ගැනීම යන කාරණා තුන

සඳහා තමන්ගේ විරෝධතාවයක් පවතින බව ද අවශ්‍ය නම් විශේෂ සභාවක් කැඳවා පසුව අනුමත කර ගැනීම සුදුසු බව ද පවසන ලදී.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් නාගරික සංවර්ධන අධිකාරිය සමඟ පැවති සාකච්ඡා අවස්ථාවේ දී මෙම ගැටලුව නොතිබුණු අතර, පසුව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමාව මේ සම්බන්ධව දැනුවත් කළ අවස්ථාවේ දී සභා අනුමැතිය ලබා ගන්නා ලෙස සඳහන් කළ බව පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා, මෙම ඉඩම් පවතින ස්ථාන මොනවා ද යන්න විමසන ලදී.

ගරු සභාපතිතුමා පැවසුවේ සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබා ගත නොහැකි ඉඩම් ප්‍රමාණයක් පවතින අතර, එම ඉඩම්වලින් ප්‍රමාණයක් මෙහි දී ඉල්ලන බවයි. එමෙන්ම නාගරික සංවර්ධන අධිකාරිය සතුව අක්කර 6.5 ක ප්‍රමාණයක් බස් නැවතුම්පළ ආසන්නයේ පවතින අතර, අනිකුත් ඉඩම් බස්නැවතුම්පළ සහ පැරණි බස්නැවතුම්පළ තුළ පවතින බව ද රථ වාහන නැවතුම් සඳහා බස්නැවතුම්පළ ඉදිරිපිට ඉඩම යොදා ගත හැකි වන බව ද මහජන පොළ තනි වහලයකට සකස් කිරීම මඟින් රථවාහන නැවතුම සඳහා ඉඩ කඩ ලබා ගත හැකි බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඊ.එම්.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් මේ සඳහා ඉඩම් ලබා දුනහොත් ඉදිරියේ දී සිදු කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩම් ප්‍රමාණවත් නොවිය හැකි බවයි.

නැවත වරක් ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මෙම ස්ථාන තාවකාලිකව ඉල්ලා සිටින බව ද සභාවේ මූලික අවශ්‍යතා හා දැවෙන ප්‍රශ්න වෙනුවෙන් ප්‍රයෝගිකව සිතන ලෙස ද පැවසීය. උදාහරණයක් වශයෙන් දොරවෙල ඔය පුළුල් කර හුණුකුඹුර හා මුගුණමලේ පාලම සකස් කිරීම සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් රුපියල් මිලියන 50 ක් වෙන් කර තිබුණ නමුත් එය ඉටු කර ගැනීමට ඉඩ ලබා නොදුන් බව ද පසුගිය දිනක නතර වූ ව්‍යාපෘති තුන ද ඒ ආකාරයෙන්ම අහිමි කර ඇති බව ද පක්ෂ භේදයක් ගැන නොසිතා ජනතාවට සේවය කිරීමට සියලුම දෙනා බැඳී සිටිය යුතු බව ද පැවසූ ගරු සභාපතිතුමා පොදු වෙළඳසැල අලුත්වැඩියා කිරීමට ලක්ෂ 98 ක් වියදම් කර තිබුණේ නම් එම වියදම වසරකින් ලබා ගැනීමට හැකිව තිබූ බව ද සම්පූර්ණයෙන් මෙම ගොඩනැගිල්ල සකස් කිරීමට විශාල මුදලක් එදාට වඩා අද වැය වන බව ද පවසන ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්. පී. ගුණරත්න මැතිතුමා, ගරු සභාපතිතුමා කරපු දෙයක් නොමැති බවට පැවසීම නිසා ඒ සඳහා පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා, වැඩ නොකෙරුවේ මම ද නැත්නම් ඔබතුමා ද යන්න මතක් කර ගන්නා ලෙසත්, තම පියා සිටින කාලයේ දී හා හිටපු ගරු සභාපතිතුමා සිටි කාලයේ දී ගරු මන්ත්‍රීවරුන් සමඟ එක් වී ඔවුන්ට වැඩ කරගෙන යාමට ඉඩ නොදී බාධා කළ බව ද ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා දුරකතනයෙන් සම්බන්ධ කර ගැනීමට මේ මොහොතේ උත්සාහ කළ ද එය ඉටු නොවූ බවද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා නැවත වරක් අදහස් දක්වමින් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා පැමිණි පසු මේ සඳහා අනුමැතිය ලබා දිය හැකි බව ද අනිකුත් ගරු මන්ත්‍රීවරුන් විරුද්ධ නොවන්නේ නම් ගැටලුවක් නොමැති අතර, මෙහි දී තමන්ගේ විරුද්ධත්වය පමණක් ප්‍රකාශ කළ බව ද පවසන ලදී.

06:01:32 හදිසි අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමෙන් අක්කර 01 ක ප්‍රමාණයක් ලබා ගැනීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මහජන පොළ තනි මහලට සකස් කිරීම යෝජනාව යටතේ සාකච්ඡා වූ අතර, සභා සම්මත නොවීය.

06:01:33 සෞඛ්‍ය කම්කරුවන් හා රියදුරන් සඳහා අවශ්‍ය වැසි කබා (කලිසම සහ කෝට්) 10 ක් මිලදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:34 රථ වාහන නැවතුම් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමෙන් අක්කර 01 ක ප්‍රමාණයක් ලබා ගැනීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මහජන පොළ තනි මහලට සකස් කිරීම යෝජනාව යටතේ සාකච්ඡා වූ අතර, සභා සම්මත නොවීය.

06:01:35 සභා දේපලවල කුලී අය කිරීමේ දී අය කරනු ලබන දඩ මුදල අය නොකර සිටීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:36 ලක්සල නිෂ්පාදිත සඳහා සතිපොළ පවත්නා ස්ථානවල අලෙවි අවස්ථා ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:37 2021 වාර්ෂික අයවැය මගින් වෙන් කර ඇති මුදලින් බැංකියවත්ත කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ සේවකයින් වෙනුවෙන් පෝෂණ මල්ල ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:38 බළන්ගොඩ නගර සභාව සතු පෙර නිමි තාර අංගනය සඳහා ජලය හා විදුලිය ලබා ගැනීම වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:39 ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වන ග්‍රාමීය මාර්ග සංවර්ධනය වැඩසටහන යටතේ ෆලීල් හාජ්ජියාර් මාවත උඩ කොටස පළමු පටුමග කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම සඳහා වැවවත්ත ප්‍රජා එකමුතු සංවිධානය වෙත ලබා දීමට 2021-10-18 දිනැති මහ සභාවේ දී අනුමත වූ නමුත් එම සමිතිය අදාල වසමේ සමිතියක් නොවන බැවින් මාර්ගය සංවර්ධනය කිරීමේ කොන්ත්‍රාත් කටයුත්ත දූනුමඩලගහවත්ත ප්‍රදේශවාසීන්ගේ සුභසාධක සංගමය වෙත ලබා දීම වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:40 ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වන ග්‍රාමීය මාර්ග සංවර්ධනය වැඩසටහන යටතේ පහත සඳහන් මාර්ග සංවර්ධනයන් සිදු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

I. ආනන්ද මෛත්‍රී ජාතික වටරවුම් පාර පටුමග සංවර්ධනය කිරීම
II. කුමාරගම පල්ලෙකුඹුර අමිල මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07. මිල ගණන් අනුමත කිරීම**

07:01 සභාවේ ගිනි නිවන උපකරණ කල් ඉකුත් වීම හේතුවෙන් ඒවා නැවත පිරවීම සඳහා A & A Enterprises Fire Protection (PVT) LTD ආයතනයෙන් ඉදිරිපත් කර ඇති රු.30,900.00 ක මිල ගණන අනුමත කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

07:02 19' LED මොනිටර් දෙකක් මිලදී ගැනීම සඳහා PC Systems ආයතනයෙන් ඉදිරිපත් කර ඇති රු.22,500.00 ක මිල ගණන අනුමත කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

07:03 GK 1483 ට්‍රැක්ටර් රථයේ ගැස්කට් දැමීම, රේඩියේටරය, ස්ටාට් මෝටරය, වයරින් එක අලුත්වැඩියා කිරීම සඳහා තෙබුවන ගරාජ් වෙතින් ඉදිරිපත් කර ඇති රු. 102650.00 ක මිල ගණන අනුමත කර අදාල සේවාව ලබා ගැනීමට සහා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

07:04 බැංකියවත්ත හා සෞඛ්‍ය අංශය සඳහා අවශ්‍ය කහ පැහැති Heavy ගම් බූට්ස් හා විල් බැරෝවක් මිලදී ගැනීම සඳහා කැඳවන ලද මිල ගණන් අනුමත කිරීම

- කහ පැහැති Heavy ගම් බූට්ස් ජෝඩු 15 ක් මිලදී ගැනීම (ජෝඩුවක් රු. 2,350.00) - ජෝති ස්ටෝර්ස්
- විල් බැරෝ Heavy 01 ක් මිලදී ගැනීම (රු. 6,500.00) - සරණි පික්චර් පැලස්

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

07:05 කොටුගොඩැල්ල වලව්ව වත්තේ ඇති සල් ගසක අතු කපා ඉවත් කිරීම සහ සපු ගසක අඩක් කපා බිම හෙළීම වෙනුවෙන් අවම මිළ වන රු. 20,500.00 ක මුදල ඉදිරිපත් කර ඇති ඒ. අනුර මහීලාල් යන අයගෙන් ලැබී ඇති මිළ ගණන අනුමත කර ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08. මන්ත්‍රී යෝජනා**

**08:01 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා**

08:01:01 පසුගිය මාසික සභා රැස්වීමේ දී එස්. එමිකා රෝෂිණී ද සිල්වා යන අය හට ස්වයං රැකියාවක් කිරීම සඳහා සම්පත් පියස අසල වසා ඇති කඩ කාමරය බදු කුලියට ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු කර දෙන්න.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව සභාවේ සාකච්ඡා වූ බැවින් නැවත සාකච්ඡා කිරීම අවශ්‍ය නොවන බව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා පැවසීය.

**08:02 ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

08:02:01 බළන්ගොඩ,මිරිස්වත්ත සුබයිර් ආලීම් මාවත කොන්ක්‍රීට් (පාර) කැඩීම නිසා අබලන් වී ඇත. එම පාර කඩිනමින් අලුත්වැඩියා කිරීම

08:02:02 බළන්ගොඩ, විලියම් මාවත ජෙයිලානි ජාතික පාසලට පිවිසෙන මාර්ගය තණකොළ කපා සුද්ධ පවිත්‍ර කිරීම

08:02:03 බළන්ගොඩ, ගොරොක්ගහමඩ මුස්ලිම් පල්ලිය ඉදිරිපිට වට රවුම් පාර විදුලි කණුව නිසා අවහිර වී ඇති අතර, එය අඩි දෙකක් පසුපසට ගත යුතුයි.

08:02:04 බළන්ගොඩ, අක්කර 18, සමගි මාවත අංක 62/339 ලිපිනයේ එස්.එම්.නසීර් යන අයගේ වත්ත හරහා අක්‍රමවත් ලෙස බැස යන වැසි ජලය නිසා සිදුව ඇති අවදානම නැති කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක් වූ ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා, ඉහත සඳහන් යෝජනා කඩිනමින් ඉටු කර දෙන ලෙස ද කරව්කැටිය ප්‍රදේශයේ මාර්ග නාම පුවරු සකස් කර දී තිබීම සම්බන්ධව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමාට ස්තුතිය පළ කරන බව ද ඒ ආකාරයෙන්ම මොබිටෙල් ආයතනයට දන්වා දෙහිගස්තලාව කොට්ඨාසය සඳහා නාම පුවරු සකස් කර දෙන ලෙස ද පැවසීය.

මේ සඳහා පිළිතුරු ලබා දුන් ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා එය ඉටු කර දෙන බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08:03 ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී. සමරසේකර මැතිතුමිය**

08:03:01 කාපට් අතුරන ලද මාර්ගයේ (ශෛලතලාරාම මාර්ගය)නන්දන කඩය අසල සහ අනුර මැදගොඩ මහතාගේ නිවස අසල කාණුව සකස් කර නොමැත. විධායක ඉංජිනේරු කාර්යාලය මඟින් මෙම කාණුව සකස් කිරීම සඳහා මේ පිළිබඳව දැනුවත් කර ලිපියක් යැවීම

08:03:02 බුද්ධ ජයන්ති මාර්ගයේ දිරාපත් වී ඇති අන්තරාදායක විදුලි ලී කණුව, රබර් වත්ත පෙර පාසල අසල විදුලි ලී කණුව, මුගුණමලය මාර්ගයේ වීරසිංහ මහතාගේ නිවස අසල විදුලි ලී කණුව ඉවත් කිරීමට ලංකා විදුලි බල මණ්ඩලය දැනුවත් කිරීම

08:03:03 මුගුණමලය මාර්ගයේ ඉහළ කොටස නඩත්තු කිරීම

08:03:04 අනඳමෙත්ගම මාර්ගයේ පළමු පටුමග සහ තුන්වන පටුමග නඩත්තු කිරීම

08:03:05 බුද්ධ ජයන්ති මාර්ගයේ පිරී ඇති පස් ගොඩ දමා කාණු පද්ධතිය සකස් කිරීම

08:03:06 කොවිඩ් රෝගය වැළඳීම හේතුවෙන් නිරෝධායනයට ලක් වන පවුල් සඳහා වියලි ආහාර මල්ලක් නොදීම හේතුවෙන් මෙම පිරිස් දැඩි පීඩාවට පත්ව ඇත. මෙම කරුණ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත යොමු කර අවශ්‍ය ප්‍රතිපාදන ගෙන්වා ගැනීමට කටයුතු කිරීම

08:03:07 වෙළඳපොලේ පවතින ගෑස් හිඟය හේතුවෙන් ජනතාව ඉමහත් පීඩාවකට පත්ව ඇත. ලාෆ්ට් ගෑස් සිලින්ඩරය වෙනුවට ලිට්රෝ ගෑස් ලබා දීමට බලධාරීන්ගේ අවධානය යොමු කිරීම

08:03:08 පොදු වෙළඳසැලේ එළවළු, මාළු, මස් වෙළෙන්දන් දැඩි පීඩාවකින් සිය වෙළඳ කටයුතු සිදු කරනු ලබයි. (ජනතාව නොපැමිණීම හේතුවෙන්) එබැවින් මාළු වෙළඳාම් කටයුතු පොදු වෙළඳසැල වෙත ගෙන ඒමට කටයුතු කරන ලෙස යෝජනා කරන අතර, එසේ නොමැති නම් පොදු වෙළඳසැල තුළ සිටින වෙළඳුන් පොළ භූමියේ වෙළඳ කටයුතු සඳහා යොමු කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය ඉහත යෝජනා ඉටු කර දෙන ලෙස ද ඒ අතර පවතින අනඳමෙත්ගම මාර්ගයේ තුන්වන පටුමග නඩත්තු කිරීම අවුරුදු 07ක කාලයක් සිදු කර නොමැති බැවින් එය ඉටු කර දෙන ලෙස ද 08:03:06 යෝජනාව අනුව කොවිඩ් වැළඳී නිරෝධායනය වන අඩු ආදායම්ලාභී පවුල් සඳහා වියලි ආහාර මල්ලක් ලබා දීමට මාසයක පමණ කාලයක් ගතවන බැවින් ඔවුන් අපහසුතාවයට පත්වන නිසා දින 02ක් ඇතුලත හෝ ලබා දෙන ලෙස සම්බන්ධීකරණ කමිටුවට යොමු කරන ලෙස ද වර්තමානයේ ගෑස් හිඟය හේතුවෙන් ජනතාව පීඩාවට පත්ව ඇති නිසා ලාෆ්ට් ගෑස් සිලින්ඩරය වෙනුවට ලිට්රෝ ගෑස් ලබා දීමට හෝ මුදල් ආපසු ලබා දීමට බලධාරීන්ගේ අවධානය යොමු කිරීමට ද 08:03:08 යෝජනාව සඳහා අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ද පවසන ලදී.

මේ සම්බන්ධව අදහස් දක්වූ ගරු සභාපතිතුමා, ඉදිරියේ දී ගෑස් ගැටලුවට විසඳුමක් ලැබෙන බව ද පොදු වෙළඳසැල සම්බන්ධ යෝජනාවට ඉදිරියේ දී අවශ්‍ය පියවරක් ගත යුතු බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා, 08:03:01 යෝජනාව ඉටු කිරීම සඳහා තමන් අදාල ආයතන සමඟ කතා කළ අතර, මෙම වසර ඇතුලත එම කාණු සකස් කර දෙන බවට එහි දී පොරොන්දු වූ බව පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08:04 ගරු නාගරික මන්ත්‍රිනී අයි.ඒ.එම්. ඉලංගකෝන් මැතිතුමිය**

08:04:01 ඇල්ලෙපොල මාළිගාතැන්න මාර්ගයේ කාණු දෙපස සුද්ධ පවිත්‍ර කිරීම හා මහා මාර්ගයේ දෙපස විදුලි පහන් කණුවල දැවී ගිය විදුලි පහන් දැමීම

08:04:02 ඇල්ලෙපොල සරස්වතී මාර්ගයේ අවසන් කොටස පාර දෙපස ඇති කාණු පද්ධතිය හා දෙපස සුද්ධ පවිත්‍ර කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී එම්. ශාන්තිලේඛා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රීනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය අදහස් දක්වමින් ඉහත යෝජනා ඉටු කරදෙන ලෙසත්, වතුර කඩය ඉදිරිපිටට විදුලි පහන් යොදන ලෙසත් පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08:05 ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා**

08:05:01 කිරිදිගල සිට ඇල්ලඅරාව දක්වා මාර්ගය දෙපස ඇති කාණු පද්ධතිය සුද්ධ කිරීම

08:05:02 ජනපද පාරේ ඇති වලවල් ප්‍රිමික්ස් යොදා මාර්ගය සකස් කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා අදහස් දක්වමින් කිරිදිගල සිට ඇල්ලෙඅරාව දක්වා කාණු පද්ධතිය පස්වලින් පිරී ඇති අතර, තණකොළ වැවී ඇති බව ද එහි ඡායාරූප වැඩ අධිකාරීතුමාට පෙන් වූ පසු මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සුද්ධ කර ඇති නමුත් පස් ඉවත් කර නොමැති බව ද මේ නිසා තැනින් තැන වතුර වලවල් පිරී පවතින බව ද ඒ සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරියට දැනුම් දෙන ලෙස ද ජනපද පාරේ හා බුද්ධ ජයන්ති පාරේ ඇති වලවල් ප්‍රිමික්ස් යොදා සකස් කරන ලෙස ද පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**09. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

**10. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

මෙහි දී අදහස් දැක් වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා, ජේසීබී යන්ත්‍රයේ ආදායම රු. 166,080.00 ක් හා ඉන්ධන 136,612.00 ක් වැය වී ඇති බව සටහන්ව ඇති අතර, එය එසේ විය හැකිදැයි විමසන ලදී.

ගරු සභාපතිතුමා පැවසුවේ සභාවට සැපයූ සේවා සඳහා වූ ඉන්ධන වියදම ද මෙහි අන්තර්ගතව ඇති අතර, ඉන්ධන වැයවීමේ දී තමන්ගේ අනුමැතියෙන් හා වැඩ අධිකාරීතුමාගේ අධීක්ෂණයෙන් එම කටයුතු සිදු වන බැවින් අනවශ්‍ය ලෙස වැය වීමක් සිදු නොවන බවයි.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා, ජේසීබී යන්ත්‍රය කර්මාන්ත අංශයේ වැඩවලට යොදවන බැවින් ආයතනය තුළ වැඩ කළ පැය ගණන වෙනම සටහන් කිරීම සුදුසු බව පවසන ලදී.

**2021-11-01 සිට 2021-11-30 දක්වා ආදායම් හා වියදම්**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 9,545,012.92 |
| වෙනත් ලැබීම් | 3,454,668.54 |
| මුලු ලැබීම් | 12,999,681.46 |
| පුනරාවර්තන වියදම් | 10,779,412.24 |
| වෙනත් වියදම් | 1,071,723.15 |
| මුලු වියදම් | 11,851,135.39 |

**2021-11-01 සිට 2021-11-30 දක්වා ඉන්ධන වාර්තාව**

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 56-1906 | 17,538.00 |
| 227-5020 | 45,113.73 |
| 226-7521 | 6,549.00 |
| BC-0005 | 22,200.00 |
| DDR 0008 | 400.00 |
| GC 0001 | 4,710.00 |
| HF7899 | 72,183.00 |
| ZA 5039 | 229,054.00 |
| LL - 7688 | 13,320.00 |
| JD-4684 | 2,826.00 |
| LL-2110 | 157.00 |
| ND-5124 | 27,759.99 |
| PF-4006 | 48,080.16 |
| QL-2901 | 3,768.00 |
| RC-1107 | 12,278.00 |
| RD 8000 | 6,327.00 |
| RE 2600 | 11,424.00 |
| RC8183 | 24,687.80 |
| 37-7933 | 4,551.00 |
| RD8240 | 34,222.00 |
| SDRR0013 | 555.00 |
| VI 1833 | 1,570.00 |
| RB 4786 | 16,556.76 |
| RC 1118 | 10,656.00 |
| ZA0228 | 3,885.00 |
| UQ 1933 | 3,140.00 |
| **එකතුව** | **623,511.44** |

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**11. ඇස්තමේන්තු අනුමත කිරීම**

11:01 **ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

11:01:01 අධික වර්ෂාව නිසා කැඩී ගිය දෙවට පාර කාණුව අලුත්වැඩියා කිරීම සඳහා ඇස්තමේන්තු මුදල - රු. 366,120.38

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**12. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් පසුගිය සභාවේ දී මස් කඩ ටෙන්ඩර්ය පිළිබඳව සාකච්ඡා කළ අතර, එහි ඇතුලත් කළ නව කොන්දේසි වන ශ්‍රී ලංකාවේ සිටින ඕනෑම අයෙකුට ටෙන්ඩරය ලබා ගැනීමට හැකි නමුත් රත්නපුර දිස්ත්‍රික්කයේ ඕනෑම ගව සෝතකාගාරයකින් මස් ගත යුතුය යන්න සඳහා තමන් විරුද්ධ බව ද මීට පෙර මස් ලබා ගත් ක්‍රමවේදය හා මෙම ක්‍රමවේදය අතර කිසිදු වෙනසක් නොමැති බව ද නිවැරදි සැලැස්මකට කටයුතු කරන්නේ නම් ප්‍රශ්න ඇති නොවන බව ද මස්කඩ එකක් පමණක් තිබීමෙන් ඒකාධිපතිවීම සිදුවන බැවින් තවත් මස් කඩයක් ටෙන්ඩර් කිරීම සඳහා ඉල්ලීමක් සිදු කරන බව ද එමගින් තරගකාරී තත්ත්වයක් ඇති වන අතර, මහජනතාවට මස් ගැනීමේ දී අඩු මුදලකට ලබා ගත හැකි වන බව ද පැවසීය.

එමෙන්ම ආණ්ඩුව සඳහා දොස් නැගුව ද මාර්ග කාපට් කිරීමේ කටයුතු ඉතා හොඳින් සිදුවන බව ද ඒ සම්බන්ධව තම සතුට ප්‍රකාශ කරන බව ද බළන්ගොඩ තැපැල් කාර්යාලය මුද්දර විකිණීම පමණක් සිදු කරන අතර, විශාල ගොඩනැගිල්ලක් ඒ සඳහා වෙන්ව තිබීම අවාසියක් බව ද එය වෙළඳ සංකීර්ණයක්, රැස්වීම් ශාලාවක් වැනි කටයුත්තකට යොදා ගත හැකි බැවින් තැපැල් කාර්යාලය සඳහා අඩු ඉඩකඩක් වෙන් කර ඉතිරි කොටස සංවර්ධන ව්‍යාපෘතියකට යොදා ගන්නා ලෙස ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමාගෙන් ඉල්ලීමක් කරන බව ද කල්තොට ෆලීල් හාජ්ජියාර් මාවත පිවිසුම් ස්ථානයෙන් මහා මාර්ගයට වාහනයක් දැමීමේ දී විනාඩි 05ක් හෝ 10 ක් රැඳී සිටින්නට වන බැවින් ප්‍රධාන පාරේ එම ස්ථානයේ වේගය සීමා කිරීම සඳහා කිසියම් හෝ වැඩ පිළිවෙලක් යොදන ලෙස ද මහජන පොළ මාර්ගය අබලන් වී ඇති අතර, එම මාර්ගය සංවර්ධනය කරන තෙක් නඩත්තුවක් හෝ සිදු කර දෙන ලෙස ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය අදහස් දක්වමින් බළන්ගොඩ මොහාන් සාලිය එල්ලාවල මාවතෙහි පවතින පිරිසිදු ජල උල්පත ප්‍රයෝජනයට ගන්නා විශාල පිරිසක් සිටින අතර, එම ස්ථානයේ තවදුරටත් පවතින අඩුපාඩු සකස් කර බීමට ඇති පිරිසිදු ජලය ලෙස බෝඩ් එකක් බළන්ගොඩ නගර සභාවේ නම ද සඳහන් කරමින් සවි කරන ලෙස ද ඉදිරියේ දී මෙම ස්ථානය පුවත්පතක හෝ රූපවාහිනියක දැක ගැනීමට හැකියාවක් ලැබිය හැකි බව ද ගරු මන්ත්‍රීතුමන්ලා ඇතුළු සියලු දෙනාට සමාජ සේවාවක් සිදු කළ බවට කෙදිනක හෝ සතුටු වීමට හැකි වන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා ඕලුගංතොට සිට ඇල්ලෙ අරාව දක්වා කාණු සුද්ධ කර නොමැති බවට පැවසූ නමුත් තමන් පසුගිය සභාවක දී කාණුව සම්බන්ධව කතා කළ බව ද කාණු අවහිර වී වතුර නිසියාකාරව බැහැර නොයන බවද ජරාව පිරුණු වතුර  පවතින අතර, එම වතුර ඇල්ලෙඅරාවේ සිට ඇලට ගලා යන බැවින් හැකි ඉක්මනින් සුද්ධ කර දෙන ලෙස ද පැවසීය.

**ප.ව. 2.11 ට පමණ ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා සභාවෙන් පිටවෙන ලදී.**

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් පළමුවෙන්ම එළඹෙන 2022 වර්ෂය සියලුම දෙනාට වාසනාවන්ත ජීවිතයක් ගත කිරීමට හැකි සුබ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන බව ද ජනතා නියෝජිතයින් වශයෙන් මහජනතාවගේ සුභ සිද්ධිය සඳහා අවශ්‍ය අඩුපාඩු සකස් කර දීම සභාවට පැමිණ සිදු කරන අතර, පසුගිය කාලය තුළ එවැනි අඩුපාඩු කිහිපයක් ඉටු කර ගැනීමට නොහැකි වූ බව ද ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා පැවසූ පරිදි අනාරක්ෂිත මාර්ග කිහිපයක් පවතින අතර, එම ස්ථාන සඳහා පැති කණ්නාඩි ඉල්ලා සිටි නමුත් අද වන තුරු එම කාර්යය ඉටු නොවුනු බව ද කුමාර විද්‍යාලය අසල මාර්ගයේ පවතින අනාරක්ෂිත වල දවස් දෙකකට පෙර තමන් දකින අවස්ථාව වන විට ද සකස් කර නොමැති නිසා අනතුරු ඇති විය හැකි බව ද පැවසීය.

එමෙන්ම බෝම්බුව පරගහකුඹුර නඩත්තු කටයුතු රැසක් සිදු වූ නමුත් පසුගිය දිනවල දේශගුණික තත්ත්වය හේතුවෙන් කොටසක් ඉතිරි වූ බව ද එම කොටසෙහි වැඩ අවසන් කර දෙන ලෙස ද ජනතාවට ජීවත් වීමට නොහැකි තත්ත්වයකට අද සියලු භාණ්ඩ හා ආහාර ද්‍රව්‍යවල මිල ඉහළ ගොස් ඇති බව ද නියමිත පොහොර හා තෙල් නොලැබීම නිසා වගා කටයුතු අඩාල වී ඇති බැවින් 2022 වර්ෂය තුළ සාගතයක් ඇති වේයැයි සිතෙන බව ද මේ ආකාරයට ගියහොත් කුමන ආණ්ඩුවක් බලයට පැමිණිය ද මෙම රට ඉදිරියට ගෙන යාමට හැකි වේ යැයි සිතිය නොහැකි බව ද ඉදිරි පරම්පරාවට රටක් ඉතුරු විය යුතු අතර, ගන්නා වූ තීන්දු තීරණ ජනතාවගේ ඉදිරි සුභසාධනය පිණිස ගැනීමට රට පාලනය කරන නායක මැති ඇමතිවරුන්ට හැකිවේවා යි ප්‍රාර්ථනා කරන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගරු මන්ත්‍රීවරියකගේ අභාවය සම්බන්ධව ශෝකය පළ කරන බවත්, කොවිඩ් ආසාදිතව සිටින ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා හට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරන බවත් පවසන ලදී.

එමෙන්ම 2021-05-06 වන දින නාගරික සංවර්ධන අධිකාරිය සතු ගොඩනැඟිල්ල ඉදිරිපිට ගස්වල අතු කැපූ අවස්ථාවේ දී ඒ සඳහා ගත් ක්‍රියාමාර්ගය කුමක් දැයි ගරු සභාපතිතුමාගෙන් විමසූ අතර, එහි දී ගරු සභාපතිතුමා පැවසූවේ මේ සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කරන බවත්, සමථ මණ්ඩලයෙන් විමර්ශනයක් සිදු කරන බවත්ය. සභාවේ මන්ත්‍රීවරයෙක්ට හෝ මන්ත්‍රීවරියක්ට ප්‍රශ්නයක් තිබේ නම් සභාව තුළ විසඳගත හැකිව තිබෙන අතර, පොලීසියේ හෝ සමථ මණ්ඩලයේ පැමිණිල්ලක් කිරීම සදාචාරාත්මක නැති බව ද තමන් ගස් කපා ඇති බවට සභාවේම ගරු මන්ත්‍රීවරියක් පැමිණිල්ලක් කර ඇති බව ද හිටපු ගරු සභාපතිතුමා විසින් සිටවන ලද ගස් සඳහා තමන් වතුර දැමූ බව ද ප්‍රදේශයේ සිටින සියලුම ජනතාව තමන් කළේ කුමක්දැයි දන්නා අතර, අපහසුතාවයට පත් කිරීම සඳහා මෙවැනි කටයුතු සිදු කරන්නේ නම් එය හෙළා දකින බව ද ඉතා ලැජ්ජා සහගත බව ද තමන් සමථ මණ්ඩලයට ගියේ සාක්ෂියක් ලබා දීමට බව ද පැමිණිල්ල පැමිණ නොසිටි නිසා කල් ගිය බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රීනි ජී.චන්ද්‍රලතා මැතිතුමිය, ඕනෑම ආයතනයක එවැනි දෙයක් සිදු වුවහොත් නඩු හෝ පැමිණිලි කරනු ලබන්නේ අදාල ආයතනය නෙවේදැයි විමසන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් ගස් කැපූ දින විශාල ආරවුලක් ඇති වී තිබුණු අතර, තමන් බළන්ගොඩ ප්‍රදේශයෙන් පිටත සිටි නිසා වැඩ අධිකාරීතුමාව එම ස්ථානයට යැවූ බව ද එහි දී ගස් කැපූ අයට විරුද්ධව අලාභය වෙනුවෙන් පැමිණිල්ලක් කරන ලෙස පැවසූ බව ද මන්ත්‍රීවරුන් අතර, හිත් අමනාපකම් ඇති කර නොගෙන සාධාරණ ලෙස අවශ්‍ය කටයුතු කිරීම සුදුසු බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා තවදුරටත් අදහස් දක්වමින් තමන්ට විරුද්ධව එක් සාක්ෂියක් හෝ ඉදිරිපත් කරන ලෙස අභියෝග කරන අතර, සාධාරණයක් ඉටු නොවුනහොත් තමන් පොලීසියෙන් උසාවියට යන බව ද කිසි දිනක අශෝභන සිද්ධීන් සිදු කර හෝ සම්බන්ධ වී නොමැති බව ද නගරය වෙනුවෙන් ඕනෑම අවස්ථාවක ඕනෑම ප්‍රශ්නයක දී ඉදිරිපත් වන අතර, ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය පිළිතුරු ලබා දෙනු ලැබුවත් මෙම සිද්ධිය නඩු කටයුත්තක් බැවින් අදහස් දැක්වීම අවසන් කරන බව ද මන්ත්‍රීවරයෙක්ට විරුද්ධව තවත් මන්ත්‍රීවරයෙක් යම් දෙයක් කරන්නේ නම් ගරු සභාපතිවරයාව දැනුවත් කළ යුතු බව ආඥා පනතෙහි සඳහන්ව ඇති බව ද පැවසීය.

එමෙන්ම කාර්පාර්ක් ඉදිරිපිට දකුණට හරවන්න එපා යැයි සඳහන් නාම පුවරුව නොමැති බැවින් රථවාහන හරවන බවද පොදු වෙළඳසැල වහලය සකස් කිරීම සම්බන්ධව කාර්මික නිළධාරීතුමාට ස්තුතිවන්ත වන බව ද තමන් පැවසූ ගැටළු කිහිපයක් විසඳා ඇති බව ද ඇවිදින මංතීරුවේ 90% ක් අවසන් ව ඇති අතර, එළවළු වෙළෙන්ඳන් හට එළවළු සේදීමට ගඟට යා නොහැකි බැවින් ජල කරාමයක් හෝ වෙනයම් ක්‍රමයක් සකස් කරන ලෙස ද නව බස්නැවතුම්පළේ සිට ලංකා බැංකු මාවතට පිවිසෙන මාර්ගය පස් යෙදූ අතර, එය මට්ටම් කිරීම සඳහා එක් දිනකට බැකෝ යන්ත්‍රය ලබා දෙන ලෙස ද ගරු මන්ත්‍රීවරුන්ගේ හිස් ඉඩම් පවතී නම් පස් යොදා පුරවා දීමට හැකි බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, ක්‍රීඩාංගන ඉඩම පවරා ගැනීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවීමට තිබූ ලක්ෂ 03ක මුදල ගෙවා අවසන් දැයි විමසන ලදී.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් මේ සම්බන්ධව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමාව දැනුවත් කර ඇති බව පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා තවදුරටත් අදහස් දක්වමින් කරව්කැටිය වට රවුම් පාර සහ සේනක පෙදෙසේ දෙපැත්ත සුද්ධ කරන ලෙස ද මාර්ග සඳහා සකස් කළ නාම පුවරු අතරින් නගර සභාව ඉදිරියේ නාම පුවරුව බැම්මේ අයිතිකාරයෙක් ගැටලු ඇති කරන බැවින් සවි කිරීමට නොහැකි වූ අතර, ඒ සම්බන්ධව ගරු සභාපතිතුමා අවධානය යොමු කර අවශ්‍ය කටයුතු කර දෙන ලෙස ද පුස්තකාලයේ අඩුපාඩු ඉක්මනින් සකස් කර දෙන ලෙස ද පවසන ලදී.

**ප.ව. 2.30 ට පමණ නිමල් කරුණාරත්න මැතිතුමා සභාවෙන් පිටවෙන ලදී.**

**ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

පසුගිය කාලයේ කරව්කැටිය උඩ කන්ද පාරේ දැවී ගිය විදුලි බුබුළු වෙනුවට නව විදුලි බුබුළු සවි කර ඇති අතර, ඒ සඳහා ස්තුතිවන්ත වන බව ද කරව්කැටිය පාර හංදියෙහි කැපූ කාණුව තවමත් සම්පූර්ණ වී නොමැති බැවින් ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙස ද පසුගිය කාලයේ අධික වර්ෂාව නිසා මාර්ග සේදී ගොස් ඇති අතර, එම මාර්ග සඳහා ප්‍රිමික්ස් යොදා නඩත්තු සිදු කර දෙන ලෙස ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය, සමථ මණ්ඩලයට යාමට ලිපියක් ලැබුණු නමුත් එම දිනයේ දී අසනීප තත්ත්වයක් මත කොළඹ සිටි බව ද සිද්ධිය සිදු වූ අවස්ථාවේ දී ගරු සභාපතිතුමා දුරකථනයෙන් තමන්ට කතා කර අදාල ස්ථානයට වැඩ අධිකාරීතුමා සමග යන ලෙස පැවසූ බව ද ඒ කිසිදු ස්ථානයක දී තමන් කතා නොකළ අතර, සිද්ධිය පැවසූවේ මිනිසුන් බව ද ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා සත්‍ය අවබෝධයකින් තොරව අදහස් දැක්වීම සම්බන්ධව ලැජ්ජා වන බව ද සිද්ධිය වීමට හේතුව සොයා බැලුවා මිසක කිසිවෙකුට චෝදනාවක් නොකළ බව ද පැවසීය.

එමෙන්ම නගර සභාව සතු වටිනා ගසක අතු කපා ඇති බවත්, එය සිදු කළේ කවුරුන්දැයි නොදන්නා බවත්, මේ සම්බන්ධව පරීක්ෂණයක් කරන ලෙසත් තමන් පොලීසියට ලබා දුන් කට උත්තරයේ සඳහන් වන බව ද ඵල ඇති රුකට ගල් ගසන බැවින් ඒ සම්බන්ධය බියක් නොමැති බව ද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් ආයුර්වේදය, බස්නැවතුම්පළ ආදී ඉඩම් විශාල ප්‍රමාණයක් නාගරික සංවර්ධන අධිකාරිය සතුව තිබුණු නමුත් තමන් බලයට පත් වූ පසු එම ඉඩම් අන්සතු කර ගැනීම සඳහා විශාල වැඩ කොටසක් මොහාන් එල්ලාවල මැතිතුමාගේ ශක්තිය මත සිදු කළ බව ද එම ඉඩම් ලබා නොගත්තේ නම් නගර සභාවට වුව ද ඉඩම් නොමැති වන බව ද අහිංසක මිනිසුන්ට අසාධාරණයක් වන බැවින් ඉඩම් අතහැරිය නමුත් අද වන විට නව නගරය පුළුල් කර ගැනීමට ඉඩකඩ නොමැති වී ඇති බව ද දුර දිග බලා වැඩ කළ යුතු බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා වැඩියෙන් වැඩ කරන විට ගැටලු වැඩියෙන් ඇති වන බැවින් බිය නොවන ලෙස ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමාට පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා අදහස් දක්වමින් කිරිදිගල සිට ඇල්ලෙඅරාව දක්වා කාණුව සුද්ධ කරන්න යැයි පැවසුවත් තමන් එම ප්‍රදේශයේ ජීවත් නොවන අතර, එහි ජීවත්වන ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා පැවසූ බව ද තමන් යෝජනා කළ පසු එය නොකෙරුණහොත් තවත් අයෙක් හෝ එය යෝජනා කර ඉටු කරගත යුතු බව ද පසුගිය දිනක කුමාරගම කසළ ට්‍රැක්ටරය නොයන බවට ප්‍රශ්නයක් පැමිණි පසු ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා සමග ඒ සම්බන්ධව කතා කළ බව ද එහි පාරෙන් පහළ කොටස ප්‍රාදේශීය සභාවට අයිති අතර, ඔවුන් කසළ බැහැර කරන බැවින් මෙම ප්‍රශ්නය ඇති වී ඇති බව ද ඡන්ද සංඛ්‍යාව නොබලා සීමා නිර්ණය කිරීමේ දී පාරෙන් පහළ කොටස නගර සභාවට ඇතුලත් කළේ නම් මෙවැනි ගැටලු ඇති නොවන බව ද පැවසීය.

එමෙන්ම සියඹලාගහවත්ත මාර්ගයේ පැති බැම්ම සභාවේ නඩත්තු යටතේ සිදු කරන ලෙස තමන් පැවසූ අවස්ථාවක දී ගම සමඟ පිළිසදරක් හෝ වෙනත් ක්‍රමයකින් එම බැම්ම සකස් කරන බව පැවසුව ද තවමත් ඉටු කර නොමැති බැවින් සභා නඩත්තු මඟින් හෝ සිදු කරන ලෙස ද ඒ ආශ්‍රිතව මැණික් ගැරීමක් සිදු වන බව ද කෝපිවත්ත පැති බැම්ම සකස් කරන ලෙස ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමාගේ නිවස ආසන්නයේ ඇළේ මැණික් ගැරීමක් රාත්‍රියේ දී සිදුවන බව ද සති කිහිපයක සිට කුඹුරු අක්කර 17 ක් වගා කිරීමට නොහැකි වී ඇති බව ද ඒ සම්බන්ධව කෘෂිකර්ම මධ්‍යස්ථානයට දැනුම් දීමෙන් අනතුරුව පරීක්ෂණයක් පැවැත්වෙන බව ද පැවසීය.

එමෙන්ම බළන්ගොඩගෙදර හා බෝම්බුව යා කරන පාලම සඳහා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා මඟින් ප්‍රතිපාදන වෙන් කර ගැනීමට හැකි වූ අතර, ස්ථානීය පරීක්ෂණයක් සිදු කළ බව ද එහි දී අඩි 08ක පාරක් අවශ්‍ය බව ඉංජිනේරුතුමා පැවසූ නමුත් බළන්ගොඩ ගෙදර කොටසෙන් අඩි 08ක් පැවතිය ද මිරිස්කොටුව කොටසෙහි අඩි 08ක් නොමැති බැවින් සභාවේ නඩත්තුවක් වශයෙන් ජේසීබී යන්ත්‍රය යොදවා එම පාර කපා දෙන ලෙස පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය වැඩිදුරටත් අදහස් දක්වමින් පීරිස් මහතාගේ නිවස ඉදිරිපිටින් ගමන් කරන මාර්ගය වල් බිහිවී ඇති බැවින් සභාව මඟින් සුද්ධ කර දෙන ලෙසට ගම්වාසීන්ගේ ඉල්ලීමක් පවතින අතර, ගමේ පුද්ගලයන්ට සුද්ධ කර ගැනීමට ඔහු ඉඩ නොදෙන බව ද තමන්ට ද නාම පුවරු කිහිපයක් ලබා දෙන ලෙස ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමාගෙන් ඉල්ලා සිටින බව ද එතුමා මන්ත්‍රීවරයෙක් වශයෙන් අගය කළ යුතු බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩගෙදර හා බෝම්බුව යා කරන පාලම අත්‍යවශ්‍ය පාලමක් වන නමුත් කුඹුරු ඉඩම් ගොඩ කිරීමේ දී ගැටලුවක් ඇති විය හැකි බැවින් ගොවිජන සේවා මධ්‍යස්ථානය සමඟ සාකච්ඡා කර සිදු කරන ලෙස ද තම සහයෝගය ලබා දෙන බව ද පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් 1977 විවෘත ආර්ථිකයෙන් පසු හොඳ දේට වඩා නරක දේ ගත් බව ද විදේශ බලපෑම් නොමැතිව රට ගෙන යාමට නොහැකි තත්ත්වයක් පවතින බව ද පසුගිය 2015 වර්ෂයේ මහින්ද රාජපක්ෂ මැතිතුමා පරාද වූ පසුව එතුමා ගොඩනැගූ ගුවන්තොටුපලෙහි එක්සත් ජාතික පක්ෂ නායකයින් විසින් වී ගබඩා කළ බව ද කාබනික පොහොර හොඳ තීන්දුවක් වුව ද කරනු ලබන ක්‍රමවේදය වැරදි බව ද පැවසීය.

එමෙන්ම ගරු සභාපතිතුමා හට වැඩ කිරීමට ලබා නොදෙන බවට තමන්ට චෝදනා කළ නමුදු එතුමා හට පළාත් සභාවෙන් එක් දිනක දී ලබා ගත හැකි අනුමැතීන් පවා ලබා ගැනීමට නොහැකි වී තිබෙන බව

ද තමන් සභාවන් 05 ක් නියෝජනය කර තිබුණ නමුත් එයින් දුර්වලම සභා දෙකක් පැවති බව ද ඉන් එක් සභාවක් 2002-2006 කාලය දක්වා වන අතර, අනික් සභාව මෙම සභා කාලය බව ද ගරු සභාපතිතුමාගේ පියාට වැඩ කිරීමට ඉඩ නොදුන් බවට පැවසූ නමුත් ඊට හේතුව මීළඟ සභාවේ දී අදාල සභා වාර්තාව සමග පෙන්වා දෙන බව ද හිටපු ගරු සභාපති ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමාගේ කාලයේ දී එතුමාට විරුද්ධ වූයේ වාහන වැරදි ලෙස භාවිත කිරීම වැනි කරුණු කිහිපයක් හේතුකොට ගෙන බව ද අසනීප හා උසාවි කටයුතු ආදී අවශ්‍ය සෑම අවස්ථාවල දීම උදව් කළ බව ද තම දරුවා පුස්තකාලයෙන් ඉවත් කළ නමුත් පසුව ඒ සඳහා සමාව ගත් බව ද දක්ෂ සභාපතිවරයෙක් වශයෙන් එතුමාට ගෞරව කරන බව ද වැඩ කිරීමට ඇති නොහැකියාව හේතුවෙන් තමන්ට දොස් නොකියන ලෙස ද සාධාරණව හා මධ්‍යස්ථව තමන් කටයුතු කරන බව ද අද දින සභාවේ දී පවා අනවශ්‍ය ලෙස කතා බහක් ඇති වූ අතර, එම අවස්ථාවේ දී ගරු සභාපතිතුමාට එම ක්‍රියාව නැවැත්වීමට හැකි වූ නමුත් එය එසේ නොකළ බව ද කවුරුන් හෝ තමන්ගේ වැරැද්දක් පවසන්නේ නම් එය නිවැරදි කර ගන්නා බව ද එම නිසා කිසිවෙකු සමග අමනාපයක් නොමැති බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් තම පවුලේ ඥාතීන්ගේ සියලුම මරණවල දී සභාවේ සියලුම දෙනා පැමිණි නමුත් දියණියගේ විවාහය සඳහා ආරාධනා කිරීමට නොහැකි වූයේ අමුත්තන් ගණන 50ට සීමා කරන ලෙස දන්වා තිබීම හේතුවෙන් බව ද ඒ සම්බන්ධව සමා වන ලෙස ද සභාවේ දක්ෂ නිර්මාණශීලී නිළධාරීන් සිටින අතර, එම නිළධාරීන්ගෙන් අවශ්‍ය රාජකාරී සිදු කර ගැනීම සඳහා හැකියාවක් තිබිය යුතු බව ද ගරු මන්ත්‍රී කණ්ඩායමේ අඩුපාඩු තමන් දකින බව ද පැවසීය.

එමෙන්ම පකිස්තානයේ දී අමානුෂික ලෙස ඝාතනයට ලක් වූ ප්‍රියන්ත කුමාර මහතා වෙනුවෙන් එම පවුලේ සියලු දෙනා වෙත ශෝකය පළ කරන බව ද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාට හා දේශබන්දු මහතා සහ එම මැතිනියට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරන බව ද ගරු සභාපතිතුමා මැදිහත් වී ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය සහ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමාගේ ගැටලුව විසඳා දෙන ලෙස ද ලබන්නා වූ 2022 වර්ෂය නීරෝගී සුභ වසරක් වේවා යි ප්‍රාර්ථනා කරන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා අදහස් දක්වමින් සභාවේ විනය දවසින් දවස පිරිහෙන බව ද තම පුද්ගලිකත්වය ආරක්ෂා කර ගනිමින් වැරදි අර්ථකතන සහිත වචන භාවිත නොකරන ලෙස ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටින බව ද පැවසීය.

එමෙන්ම තමන් සභාවට පැමිණි මුල්ම දිනවල නොදැනුවත්කම හේතුවෙන් අවස්ථා ගණනාවක දී විටින් විට නැගිට කතා කළ නමුත් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා එම වැරැද්ද පෙන්වා දුන් පසු අද වන තුරු තම පක්ෂය පිළිබඳ කොතරම් විවේචන ඉදිරිපත් වුව ද උත්තර ලබා නොදුන් අතර, මන්ත්‍රීවරයෙක්ට එක් වරක් පමණක් නැගිට අදහස් පළ කළ හැකි බැවින් තමන් කතා කර අවසන් වූ පසු නැවත පිළිතුරු ලබා දීමට නොගිය බව ද සභාවේ නීති රීති අනුව කටයුතු කළ යුතු බව ද පවසන ලදී.
පකිස්තානයේ දී ඝාතනයට ලක් වූ ප්‍රියන්ත කුමාර මහතා තම පක්ෂයේ සාමාජිකයෙක් වන අතර, එවැනි සිද්ධීන් අප රටේ පවා සිදු වූ බව ද විශේෂයෙන් තංගල්ල සභාවේ සභාපතිවරයා විසින් එංගලන්ත

තරුණියක් 10 දෙනෙකු සමඟ දූෂණය කර, තරුණයාව පහර දී මරා දැමීමේ සිද්ධියේ දී ජාත්‍යන්තරව ශ්‍රී ලංකාව විශාල අපකීර්තියකට ලක් වූ බව ද ලෝකයේ කුමන ස්ථානයක සිදු වුව ද හෙළා දැකිය යුතු බව ද මේ වන විට අප රටේ සිදු වන්නා වූ බඩු මිල වැඩි වීම ආදී කරුණු වෙනුවෙන් ආණ්ඩුවට විසඳුම් නොමැති බව ද ධනේශ්වර ක්‍රමය හරහා මෙම සිද්ධීන් සිදු වන අතර, එය වෙනස් කිරීම සඳහා කැප කිරීම් කරන බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා, ගරු සභාපතිතුමා දේශපාලයෙන් ඉවත් වන බවට ආරංචියක් ලැබුණු බව ද ඒ ඒ අවස්ථාවල පවතින මනෝ මූල හා මානසික තත්ත්වයන් පදනම් කරගෙන දේශපාලන වෙනස්කම් සිදුවන බැවින් දේශපාලන අනාගතයක් ඇති තරුණයෙක් වශයෙන් දේශපාලනයෙන් ඉවත් නොවන ලෙස ද හැකි නම් තම පක්ෂය සමඟ එක්වන ලෙස ද මේ වන විට තරුණ පිරිසකගේ දැඩි උනන්දුවක් පක්ෂය කෙරෙහි ඇති වී ඇති බව ද පැවසීය.

එමෙන්ම වෙනත් නිළධාරියෙක් හෝ අදාල අංශයක් විසින් කළ යුතු කාර්යයක් සඳහා ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය මැදිහත් වීම නිසා ගැටලු රැසක් ඇති වී ඇති බැවින් එවැනි කටයුතු සිදු නොකරන ලෙස එතුමියට පවසන බව ද සඳහන් කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ප.ව.3.09 ට ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා සභාවෙන් පිටවෙන ලදී.**

**ගරු නාගරික මන්ත්‍රී ඊ.එම්.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් දොරවෙල පබ්ලිස් මහතාගේ පාරෙහි නඩත්තු කටයුතු සිදු කර දෙන ලෙස ද අද වන විට මිනිසුන් අමාරුවෙන් ජීවත් වන බව ද එය මෙම ආණ්ඩුව නිසා සිදු වූවක් නොව විවෘත ආර්ථිකය නිසා තමන් ගැන පමණක් සිතන පිරිසක් බිහි වී ඇති බව ද හිටපු ගරු අග්‍රාමාත්‍ය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිතුමිය සිදු කළ වෙනස්කම් හේතුවෙන් අවුරුදු 17 ක් යනතුරු බලය ලබා ගැනීමට නොහැකි වූ බව ද ගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සෞභාග්‍යයේ දැක්ම අනුව වගා කටයුතු සිදු කිරීමට අපේක්ෂා කළ නමුත් මිනිසුන් ඉවසීමට අකමැති බව ද මේ වන විට එය තේරුම් ගෙන කොම්පෝස්ට් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන බව ද තමන් සභාවේ පක්ෂව හෝ විපක්ෂව ගැටලු ඇති කර හෝ පුද්ගලික චරිත ඝාතනය කර හෝ නොමැති බව ද සැහැල්ලුවෙන් විහිලුවෙන් කතා නොකර අදාල දේ කතා කරන ලෙස ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමාගෙන් ඉල්ලා සිටින බව ද තමන්ගෙන් වැරදි වචනයක් කියවුණි නම් එයට සමා වෙන ලෙස ද පවසමින් 2022 වර්ෂය නිදුක් නිරෝගී සුබ නව වසරක් වේවා යි ප්‍රාර්ථනා කරන බව ද සඳහන් කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**13. අවසානය**

ගරු සභාපතිතුමන් අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී කණ්ඩායමක් විසින් චේතනාන්විතව හා සංවිධානාත්මකව සිදු කරනු ලබන යම් යම් සංවිධානාත්මක ක්‍රියා පිළිවෙත් හේතුවෙන් තමන්ට ලැබෙන පන්නරයට ස්තුතිවන්ත වන බව ද  එය සභාව කරගෙන යාමට පමණක් නොව පුද්ගලික ජීවිතයට පවා විශාල පන්නරයක් වූ බව ද රටේ කුමන ස්ථානයකට ගිය ද සියලුම වැඩ කටයුතු හා ගනුදෙනු කර ගැනීමට හැකි වාතාවරණය ලබා දී ඇති බව ද තමන් බළන්ගොඩ නගර සභාවේ සභාපතිවරයා වශයෙන් පත් වූ පසු ගරු ආණ්ඩුකාරවරයෙක් හා ආණ්ඩුකාරවරියක් යටතේ රාජකාරී සිදු කළ බව ද එම කාලයේ

අවශ්‍ය සහයෝගයන් ලැබුණු බව ද වර්තමාන ගරු ආණ්ඩුකාරතුමා ද ඒ ආකාරයෙන්ම තමන් කුමන ආකාරයේ පුද්ගලයෙක්දැයි හඳුනා ගෙන සිටි නමුත් ඔබතුමන්ලාගේ කණ්ඩායම හා සංවිධායකතුමා විසින් එම ඥාති සම්බන්ධතා හා දේශපාලන හිතවත්කම් මත නගර සභාවේ සභාපතිවරයා වශයෙන් තමන් කෙරෙහි පැවති යහපත් ආකල්පය නැති කර දැමූ බව ද එයට සම්පූර්ණයෙන්ම එම කණ්ඩායම වගකිව යුතු බව ද මේ නිසා ගරු ආණ්ඩුකාරතුමා වෙත ගොස් අවශ්‍ය වැඩ කටයුතු සිදු කර ගැනීමට නොහැකි වූ බැවින් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා හරහා එම කටයුතු සිදු කරනු ලබන බව ද එසේ නොමැතිව එය තමන්ගේ නොහැකියාවක් හෝ අදක්ෂතාවයක් නොවන බව ද පැවසීය.

එමෙන්ම තමන් දේශපාලන බලය කෙරෙහි ආසාවෙන් කටයුතු නොකරන අතර, මනුස්සකමෙන් ඕනම කාර්යයක් කර ගැනීමට හැකි බව ද වැඩ කරගන්න බලය ලබා දෙන ලෙස සාධාරණව ඉල්ලීමක් කරන්නේ නම් තමන් සලකා බලන බව ද ජනතාවගේ බදු මුදලින් හා හිටපු සභාපතිවරුන්ගේ ක්‍රියාදාමයන් තුළින් සභාව වැඩි දියුණු වී ඇති බව ද මෙම වසරේ අයවැය සඳහා ප්‍රශ්න ඇති කර,අයවැය සම්මත නොමැති බවට ආණ්ඩුකාරතුමාට ලිඛිතව දැනුම් දී එතුමාගේ සහය ඇතිව නීතිපති දෙපාර්තමේන්තුවට ගොස් ඇති අතර, එහි මතය මේ වන විට ලැබී ඇති බව ද අයවැය සම්මත ආකාරයෙන් එම මතය ලැබී ඇති නමුත් ප්‍රජාවට වැඩ කිරීමට ඇති කාලය අවසන්ව ඇති බව ද 2022 වර්ෂයේ දී එවැනි දෙයක් සිදු නොවේවායි සිතන අතර, තමන් නීතියට හා පනතට අනුව රාජකාරී කටයුතු සිදු කරන බව ද නිවැරදි දේ වෙනුවෙන් ඕනෑම අවස්ථාවක කටයුතු කරන බව ද පවසමින් අද දින සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් සියලු දෙනාට ස්තුතිය පළ කරමින් මෙදින මහ සභාවේ වැඩ කටයුතු ප.ව.3.25 ට පමණ අවසන් කරන ලදී.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.